# ශ්‍රී ලංකා කජු සංස්ථාව

# 2021

# ශ්‍රී ලංකා කජු සංස්ථාව



# වාර්ෂික වාර්තාව - 2021

| පටුන | පිටුව |
|---|---|
| • ශ්‍රී ලංකා කපු සංස්ථාවේ දැක්ම, මෙහෙවර, ඉලක්ක හා අරමුණු | 01 - 02 |
| • හැඳින්වීම | 03 - 04 |
| • සභාපතිනියගේ පණිවිඩය | 05 - 06 |
| • ශ්‍රී ලංකා කපු සංස්ථාව පිළිබඳ සැකෙවින් | 07 - 18 |
| 01. ව්‍යාප්ති හා පර්යේෂණ අංශය | 19 - 22 |
| 02. වැවිලි අංශය | 23 - 28 |
| 03. අලෙවි හා පිරිසැකසුම් අංශය | 29 - 34 |
| 04. මානව සම්පත් හා පාලන අංශය | 35 - 38 |
| 05. අභ්‍යන්තර විගණන අංශය | 39 - 44 |
| 06. මුදල් අංශය | 45 - 61 |
| 07. වසර 05 ක ගිණුම් සාරාංශ | 62 |
| 08. 2021 වර්ෂය සඳහා කාර්යය සාධන වාර්තාව | 63 - 66 |
| 09. ශ්‍රී ලංකා කපු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග | 67 - 72 |
| 10. කාර්යය සාධනය පිළිබඳ වසර 05 ක සාරාංශය | 73 - 75 |
| 11. 1971 අංක 38 දරණ මුදල් පනෙත් 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 76 - 84 |
| 12. විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග | 85 - 104 |

## දැක්ම

ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

## මෙහෙවර

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාළ පාර්ශවයන් වෙත වෘත්තීයමය මඟ පෙන්වීම ලබා දීම තුළින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟා කර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

# ඉලක්ක හා අරමුණු

ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් සහ ඉහළ අපනයන ධාරිතාවයක් සඳහා ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ව්‍යාප්තිය, පිරිසැකසුම්කරණය, අලෙවිකරණ හා සහතිකකරණයේ ඵලදායීතාවය ඉහළ නැංවීම.

- වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම .
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායීතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයනය දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත් කිරීම.
- ලාභ ඉපැයීම මඟින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

# හැඳින්වීම

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී.

කජු සංස්ථාව රාජ්‍ය ව්‍යාපාරික ආයතනයක් වශයෙන් පිහිටුවනු ලැබූ බැවින්, කජු ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම ආරම්භයේ සිටම සිදුකරන ලදි. පසුකාලීනව කජු ක්ෂේත්‍රය ආශ්‍රිතව දේශීය වශයෙන් පැනනැගුණු ගැටළු නිරාකරණය සඳහා මැදිහත්ව සේවා සැපයීම සිදුකරනු ලබයි. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකා කජු සංස්ථාව රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් වශයෙන් හා සේවා සැපයීම් ආයතනයක් වශයෙන් කටයුතු සිදුකරනු ලැබේ.

සංස්ථාව සතු වෙළඳසැල් ජාලය හා වෙනත් අලෙවි ක්‍රමවේද උපයෝගී කරගෙන 2021 ජනවාරි මස 01 දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සක්‍රීය දායකත්වය මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

එකී පනත ප්‍රකාරව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්යභාරය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

(අ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු සිදුකිරීම.

(ඇ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඈ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතුවලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඉ) කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අලුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඊ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(ඩ) කජු වගා කිරීම, කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම හා සම්බන්ධ සියළු පාර්ශවයන් වෙත ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගෙන පුහුණුව ලබා දීම හා ඒ සඳහා පහසුකම් සැපයීම.

(ඬ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාර දීම.

(ඵ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොළවල් තුළ ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට ආධාර දීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය -2021

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ආර්.ඒ. සාරංගා රත්නායක මහත්මිය | සභාපතිනිය |
| 02. | අශෝකා ලංකාතිලක මහත්මිය | නියෝජ්‍ය සභාපතිනිය |
| 03. | සී.සී. මුහන්දිරම්ගේ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2021.01.26 - 2021.03.31 දක්වා) |
| 04. | එච්.එම්.සී.කේ. හේරත් මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) |
| 05. | චාමර සුභසිංහ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 06. | උපාලි වඩුආරච්චි මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 07. | අයි.ඩබ්.ඒ. සමන් කුමාර මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 08. | මේජර් ඩී. මැදගෙදර මයා | සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (2021.01.01 සිට 2021.03.31 දක්වා ) |
| 09. | පී.බී. කොඩිකාර මයා | වැ.බ. සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, (2021.03.31 සිට 2021.12.31 දක්වා) |

## සභාපතිනියගේ පණිවිඩය



ඊසාන දිග බ්‍රසීලයේ සම්භවයක් ඇති කජු ශාකය 16 වන ශතවර්ෂයේදී ඉන්දියාවේ ගෝවා ප්‍රාන්තය හරහා පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වාදී ඇත. ශ්‍රී ලංකාවේ වයඹ දිග මුහුදුබඩ තීරයේ මුල් අවස්ථාවේ වගා කර ඇති අතර, පසුකාලීනව වියලි දේශගුණයක් ඇති කලාපවල වැවිය හැකි භෝගයක් ලෙස ප්‍රචලිත වී ඇත.  වර්තමානයේදී මෙය වාණිජමය වශයෙන් වැදගත් ඉහළ කෘෂිකාර්මික ශක්‍යතාවයක් ඇති භෝගයක් ලෙස හඳුන්වාදිය හැකිය.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව කජු වගාව කෙරෙහි කෘෂි ක්ෂේත්‍රයේ නියුක්තවූවන් අවධානය යොමු කළ අතර, විශේෂයෙන්ම 1973 දී ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපිත කිරීමෙන් පසුව කජු කර්මාන්තය වඩාත් ප්‍රචලිත වී ඇත. ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත කජු කර්මාන්තයේ සංවර්ධනය ප්‍රධාන වශයෙන් පැවරී ඇත.

වර්තමානයේ කජු මද මඟින් සකස් කරන ලද ආහාර විශේෂයෙන් සිංහල අලුත් අවුරුදු සහ නත්තල් සමයට රසකැවිලි, කේක්, ව්‍යාංජන ලෙස භාවිත කරන අතර, කජු ලෙල්ලෙන් (Cashew Nut Liquid Oil) ලැකර්, තීන්ත, ප්ලාස්ටික් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීමේ හැකියාවක් ඇත.

කජු මද සහ කජු නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළෙහි විශාල ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාවේ කජු මදවල ඇති ඇත්දත් පැහැය, ප්‍රමාණයෙන් විශාල වීම, කජු මදය වටා ඇති සීනි සහිත ආවරණය නිසා ගෝලීය වෙළඳපොළෙහි විශාල ඉල්ලුමක් ඇති අතර, එම ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කජු නිෂ්පාදනයක් සිදු නොවේ.  වාර්ෂිකව ලෙලි කජු මෙට්‍රික් ටොන් 25,000ක් පමණ ඉල්ලුම පවතින අතර, නිෂ්පාදනය වනුයේ මෙට්‍රික් ටොන් 12,000ක පමණ ප්‍රමාණයකි. මෙම තත්ත්වය අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අහිතකර ලෙස බලපා ඇත.

2020 වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වතුයායන්හි ලෙලි කජු අස්වැන්න මෙට්‍රික් ටොන් 150.0ක් වූ අතර, එය 2021 වර්ෂයේ මෙට්‍රික් ටොන් 106කි.  මෙය 2020 වර්ෂය හා සාපේක්ෂව 29.3%ක අඩුවීමකි. මේ සඳහා බලපෑ හේතු ලෙස 2019 සහ 2020 වර්ෂවල සැලකිය යුතු අස්වැන්නක් ලැබුණු පසු ඊළඟ වසරේ කජු ශාකයේ භෞතික ලක්ෂණ අනුව අස්වැන්න අඩුවීමක් හා පසුගිය වසරේ අස්වනු ලැබූ පසු කජු වගාව දැඩි නියඟයකට ලක්වීම නිසා යන කරුණු මත 2021 වර්ෂයේ සමස්ත අස්වැන්න අඩුවී ඇත. 2021 වර්ෂයේ දේශීය අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 26.26ක් වූ අතර අපනයන වටිනාකම

රු.මි. 89.07කි. මෙම වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත සහ කජු මඳවල දේශීය මිල ඉහළයාම යන කරුණු මත අපනයනය අඩුවී ඇත.

2021 වර්ෂය තුළදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තූතිය හා ප්‍රණාමය ඔවුන් වෙත පුද කරමි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායීතාවයකින් හා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියළු කාර්යය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ අතර, ඔවුන්ගේ සේවයද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම් හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකිවූ අතර, එයද අගය කරමි.

වැවිලි අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමන් සහ උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මැතිතුමන් සහ එම අමාත්‍යාංශයන්හි ලේකම්තුමන්ලා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අප වෙත ලබා දුන් මහ පෙන්වීම වෙනුවෙන් ද ස්තූතිවන්ත වෙමි.



**නිතීඥ සාරංගා රත්නායක**

**සභාපතිනි**

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

## ශ්‍රී ලංකා කජු සංස්ථාව පිළිබඳ සැකෙවින්

දිවයිනේ ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායීතාවයෙන් යුක්තව සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල 11ක්, වතුයායන් 08ක්, පිරිසැකසුම් මධ්‍යස්ථාන 02ක්, පර්යේෂණ අංශ 02ක්, මධ්‍යම පැළ තවාන් 08ක්, බීජ උද්‍යාන 05ක්, අලෙවිසැල් 09ක්, සංචාරක බංගලා 02ක් හා වරලත් අලෙවිසැල් 69කින් ශ්‍රී ලංකා කජු සංස්ථාව සමන්විත වේ.

### ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා කජු සංස්ථාව,
අංක 1334, පරණ කෝට්ටේ පාර,
රාජගිරිය.

<u>දුරකථන අංක</u>

| | | |
|---|---|---|
| සභාපති | - | 011 - 2871005 |
| නියෝජ්‍ය සභාපති | - | 011 - 2869844 |
| සාමාන්‍යාධිකාරී | - | 011 - 2876134 |
| ෆැක්ස් | - | 011 - 2869843 |
| ඊ මේල් | - | cashewco@sltnet.lk |
| වෙබ් අඩවිය | - | www.cashew.gov.lk |

## 2021 වර්ෂය තුළදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සේවය කරන සේවක සංඛ්‍යාව

| වැටුප් කේතය | තනතුර | අනුමත සංඛ්‍යාව | 2021 වර්ෂයේදී සිටින සේවක ප්‍රමාණය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| HM 1-3 | සාමාන්‍යාධිකාරි | 01 | - | - | 01 |
| HM 1-1 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | 01 | 01 | - | - |
| MM 1-1 | සහකාර සාමාන්‍යාධිකාරි - අභ්‍යන්තර විගණන | 01 | 01 | - | - |
| | සහකාර සාමාන්‍යාධිකාරි - මුදල් | 01 | 01 | - | - |
| | සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා පාලන | 01 | 01 | - | - |
| | සහකාර සාමාන්‍යාධිකාරි - ප්‍රතිපත්ති හා සැලසුම් | 01 | 01 | - | - |
| | සහකාර සාමාන්‍යාධිකාරි - අලෙවි හා පිරිසැකසුම් | 01 | 01 | - | - |
| | සහකාර සාමාන්‍යාධිකාරි - ව්‍යාප්ති හා පර්යේෂණ | 01 | - | - | 01 |
| | සහකාර සාමාන්‍යාධිකාරි - වැවිලි | 01 | - | - | 01 |
| JM 1-1 | ප්‍රාදේශීය කළමනාකරු/ ස.ප්‍රාදේශීය කළමනාකරු | 11 | 07 | 01 | 03 |
| | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි/ පර්යේෂණ නිලධාරි | 02 | 01 | - | 01 |
| | වැවිලි නිලධාරි | 01 | 01 | - | - |
| | ව්‍යාප්ති නිලධාරි | 01 | 01 | - | - |
| | වතු අධිකාරි | 04 | 02 | - | 02 |
| | තත්ත්ව සහතික කිරීමේ නිලධාරී | 02 | 01 | - | 01 |
| | පරිපාලන නිලධාරි | 01 | 01 | - | - |
| | මූල්‍ය නිලධාරි | 01 | 01 | - | - |
| | අලෙවි ප්‍රවර්ධන නිලධාරි | 01 | 01 | - | - |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | - | - | 01 |
| | සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් නිලධාරි | 01 | 01 | - | - |
| MA - 4 | භාෂා පරිවර්තක | 01 | - | - | 01 |
| MA 2-1 | වැවිලි සහකාර | 37 | 15 | 04 | 18 |
| | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | - | - |
| | විගණන සහකාර | 02 | 02 | - | - |
| | මූල්‍ය සහකාර | 01 | 01 | - | - |
| | ප්‍රවාහන සහකාර | 01 | 01 | - | - |
| MA 1-1 | කළමනාකරණ සහකාර | 57 | 41 | 17 | - |
| | ක්ෂේත්‍ර සහකාර | 22 | 11 | - | 11 |
| PL - 3 | රියැදුරු | 26 | 19 | 05 | 02 |
| | බොයිලර් යන්ත්‍ර ක්‍රියාකරු | 02 | 01 | 01 | - |
| PL - 2 | කම්කරු පරිපාලක | 07 | 08 | - | - |
| | සංචාරක බංගලා භාරකරු | 03 | - | 01 | 02 |
| PL - 1 | කාර්යාල සහායක | 16 | 15 | 09 | - |
| | මුරකරු | 11 | 08 | 04 | - |
| | වාහන සහායක | 02 | 01 | 01 | - |
| | | **<u>224</u>** | **<u>147</u>** | **<u>43</u>** | **<u>45</u>** |

* *සේවා අවශ්‍යතාවය මත සිදු කළ බඳවාගැනීම් හේතුකොට ගෙන 2021.12.31 දිනට කළමනාකරණ සහකාර 01ක්, කම්කරු පරිපාලක 01ක්, මුරකරු 01ක් හා කාර්යාල සහායක 08ක් වශයෙන් සමස්තය 11ක් වන සේවක අතිරික්තයක් පවතී.*

# ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය



# ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා සේවා ජාලය



## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ඉහළ කළමනාකරණය - 2021

| | | | |
|---|---|---|---|
| I). | මේජර් ඩී. මැදගෙදර මහතා | - | සාමාන්‍යාධිකාරී (2021.01.01 සිට 2021.03.31 දක්වා) |
| II). | පී.බී. කොඩිකාර මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ වැ.සාමාන්‍යාධිකාරී (2021.03.31 සිට) |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මධ්‍යම කළමනාකරණ කාර්යය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| I). | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී - මුදල් |
| II). | ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී -ව්‍යාප්ති හා පර්යේෂණ |
| III). | වී.යූ. ලියනගේ මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන |
| IV). | ආර්.එම්.පී. ජයතිස්ස මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී අලෙවි හා පිරිසැකසුම් |
| V). | පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී -වැවිලි |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ පවතින අංශ

ශ්‍රී ලංකා කපු සංස්ථාව සතුව අංශ 07ක් පවතී.

01. ව්‍යාප්ති හා පර්යේෂණ අංශය
02. පාලන අංශය
03. මූල්‍ය අංශය
04. අභ්‍යන්තර විගණන අංශය
05. වැවිලි අංශය
06. අලෙවි සහ පිරිසැකසුම් අංශය
07. ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය

| නම හා තනතුර | | ආවරණය වන දිස්ත්‍රික්කය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 1. | එන්.ඩී. වරුසවිතාරණ<br>ප්‍රාදේශීය කළමනාකරු | අනුරාධපුරය | ශ්‍රී ලංකා කපු සංස්ථාව<br>නිපදවන්නන්ගේ සමුපකාර සමිති ගොඩනැගිල්ල,<br>ගොඩගේ මාවත,<br>අනුරාධපුරය. | 025-2227071<br>071-8046790 |
| 2. | බුද්ධික සඳරුවන්<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | බදුල්ල/මහනුවර | ශ්‍රී ලංකා කපු සංස්ථාව<br>සී.ටී.සී හන්දිය, අළුත්තරම,<br>මහියංගනය. | 055-3555257<br>077-3410225 |
| 3. | එල්.ඩී.පතිරණගේ මහතා<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | හම්බන්තොට<br>රත්නපුර | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>මධ්‍යම පැළ තවාන, දේවාල පන්සල පාර,<br>කිරලවැල්කොටුව,<br>ඇඹිලිපිටිය. | 077-6263358 |
| 4. | එල් .සංජීවන්<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | කිලිනොච්චිය/<br>මුලතිව්/යාපනය/<br>වවුනියාව/<br>මන්නාරම | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>පරණ කච්චේරිය ගොඩනැගිල්ල,<br>කිලිනොච්චිය. | 021-2283830<br>077-9850497 |
| 5. | බුද්ධික සඳරුවන්<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | අම්පාර | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>40 වන සැතපුම් කණුව,<br>මංගලගම, අම්පාර. | 077-3410225 |
| 6. | කේ.ඒ.ඒ.එන් අමරසිංහ<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | මොණරාගල | හෝමාගම වත්ත, 22 වන සැතපුම් කණුව, නක්කල,<br>මොණරාගල. | 055-2252090<br>071-8159195 |
| 7. | කේ.බී.එස්.ජේ කාරියවසම්<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | හම්බන්තොට | ශ්‍රී ලංකා කපු සංස්ථාව<br>සිල්වාස්,<br>මල්පෙත්තාව,<br>අම්බලන්තොට. | 071-8576359 |
| 8. | එච්.එම්.ඒ.එස්.ජයවර්ධන<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | පුත්තලම | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>ශාන්ත මරියාපාර,<br>සේනකුදිරිප්පුව, පුත්තලම. | 032-2265998<br>070-3324319 |
| 9. | එච්.ටී.ඩී දයාරත්න<br>සහකාර ප්‍රාදේශීය කළමනාකරු | මඩකලපුව/<br>පොළොන්නරුව | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>මහජන පුස්තකාලය, වී.සී පාර, වදුරමුලෙයි. | 077-6181734 |
| 10. | කේ.ඩී.මදුසංඛ<br>ස්ථානභාර නිලධාරී | මාතලේ | ශ්‍රී ලංකා කපු සංස්ථාව<br>නාලන්ද බීජ උද්‍යානය,<br>මඩවල උල්පත, මාතලේ. | 071-0144631 |
| 11. | ආර්.එස්.නරේෂ් කුමාර්<br>ස්ථානභාර නිලධාරී | ත්‍රිකුණාමලය | ශ්‍රී ලංකා කපු සංස්ථාව,<br>නුවර පාර, තඹලගමුව,<br>ත්‍රිකුණාමලය. | 077-1303648 |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වතුයායන් / බීජ උද්‍යාන

| | වතුයාය | පිහිටි දිස්ත්‍රික්කය | මුළු අක්කර ප්‍රමාණය | වගාකර ඇති අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | එළුවන්කුලම - බීජ උද්‍යානය | පුත්තලම | 210 | 245 |
| | එළුවන්කුලම - වතුයාය | | 441 | |
| 2. | කමන්දළුව වතුයාය | පුත්තලම | 548 | 494 |
| 3. | ආච්චිගෙවත්ත වතුයාය | පුත්තලම | 961 | 761 |
| 4. | හාඩි වතුයාය | මඩකලපුව | 365 | 190 |
| 5. | කොණ්ඩච්චි වතුයාය - කපු සංස්ථාව | මන්නාරම | 4,998 | 420 |
| | කොණ්ඩච්චි වතුයාය - සිවිල් ආරක්ෂක දෙ. | | 1,500 | 935 |
| 6. | මාන්කර්ණි වතුයාය | මඩකලපුව | 1,075 | 115 |
| 7. | පුනරීන් වතුයාය | කිළිනොච්චිය | 479 | 150 |
| 8. | වෙල්ලන්කුලම වතුයාය | කිළිනොච්චිය | 500 | 150 |
| 9. | තිරියාය වතුයාය | ත්‍රිකුණාමලය | 10 | 02 |
| 10. | විලච්චිය - බීජ උද්‍යානය | අනුරාධපුරය | 25 | 17 |
| 11. | සුදුවතුර ආර - බීජ උද්‍යානය | මොණරාගල | 200 | 45 |
| 12. | මහඔය - බීජ උද්‍යානය | මොණරාගල | 81 | 80 |
| 13. | නාලන්ද - බීජ උද්‍යානය | මාතලේ | 135 | 50 |
| **එකතුව** | | | **11,528** | **3,654** |

❖ ශ්‍රී ලංකා කපු සංස්ථාව යටතේ පවතින කොණ්ඩච්චි වතුයායේ මුළු අක්කර 6,498ක ප්‍රමාණයෙන් අක්කර 1,500ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර, එම අක්කර 1,500න් දැනට අක්කර 1,300ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් වගා කරනු ලබයි.

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන

| අනු අංකය | කපු පිරිසැකසුම් මධ්‍යස්ථාන | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01. | නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | ගම්පහ |
| 02. | පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය | පුත්තලම |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ පර්යේෂණ ඒකක

| අනු අංකය | පර්යේෂණ ඒකක | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01. | කමන්දළුව පර්යේෂණ ඒකකය | පුත්තලම |
| 02. | පුත්තලම පර්යේෂණ ඒකකය | පුත්තලම |

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මධ්‍යම පැළ තවාන්

| අනු අංකය | මධ්‍යම පැළ තවාන් | ආවරණය වන දිස්ත්‍රික්ක | (අක්කර) | පැළ නිෂ්පාදන ධාරිතාවය (පැළ ගණන) |
|---|---|---|---|---|
| 01. | මිහින්තලේ පැළ තවාන | අනුරාධපුරය, වව්නියාව, කිළිනොච්චිය, මුලතිව්, මන්නාරම | 2.5 | 180,000 |
| 02. | දඹුල්ල පැළ තවාන | මාතලේ, පොළොන්නරුව | 3.0 | 50,000 |
| 03. | කමන්දළුව පැළ තවාන | පුත්තලම, කුරුණෑගල | 2.0 | 170,000 |
| 04. | හාඩි පැළ තවාන | මඩකලපුව, ත්‍රිකුණාමලය | 1.0 | 42,000 |
| 05. | කුඹුක්කන පැළ තවාන | මොණරාගල | 3.0 | 160,000 |
| 06. | මහියංගනය පැළ තවාන | බදුල්ල, මහනුවර | 2.0 | 66,000 |
| 07. | චන්ද්‍රිකාවැව පැළ තවාන | හම්බන්තොට, රත්නපුරය | 0.5 | 62,000 |
| 08. | මංගලගම පැළ තවාන | අම්පාර | 0.25 | 20,000 |
| | **එකතුව** | | **14.25** | **750,000** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ බීජ උද්‍යාන

| බීජ උද්‍යාන | පිහිටි දිස්ත්‍රික්කය | මුළු අක්කර ප්‍රමාණය | වගා කර ඇති අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| 1. එළුවන්කුලම බීජ උද්‍යානය | පුත්තලම | 210 | 210 |
| 2. විලච්චිය බීජ උද්‍යානය | අනුරාධපුරය | 25 | 17 |
| 3. සුදුවතුරආර බීජ උද්‍යානය | මොණරාගල | 200 | 45 |
| 4. මහඔය බීජ උද්‍යානය | අම්පාර | 81 | 45 |
| 5. නාලන්ද බීජ උද්‍යානය | මාතලේ | 135 | 50 |
| **එකතුව** | | **651** | **367** |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ අලෙවිසැල්

| අනු අංකය | සංස්ථා කපු අලෙවිසැල් | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01. | අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය. | කොළඹ |
| 02. | අංක 518, ගාලු පාර, කොළඹ 03. | කොළඹ |
| 03. | අඹේපුස්ස කපු අලෙවිසැල. | කෑගල්ල |
| 04. | නාරාහේන්පිට කපු අලෙවිසැල, ආර්ථික මධ්‍යස්ථානය, රාජ්‍ය වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල. | කොළඹ |
| 05. | වැල්ලවත්ත කපු අලෙවිසැල, තල් සංවර්ධන මණ්ඩලය, ගාලු පාර,වැල්ලවත්ත. | කොළඹ |
| 06. | පැල්මඩුල්ල කපු අලෙවිසැල, 119/1, මහ වීදිය, පැල්මඩුල්ල. | රත්නපුර |
| 07. | ත්‍රිකුණාමලය කපු අලෙවිසැල ත්‍රිකුණාමලය- නුවර පාර, තඹලගමුව, ත්‍රිකුණාමලය. | ත්‍රිකුණාමලය |
| 08. | බලංගොඩ කපු අලෙවිසැල, 122 D, බාන්ස් රත්වත්ත මාවත, බලන්ගොඩ. | රත්නපුර |
| 09. | බඩගමුව කපු අලෙවිසැල, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, දඹුල්ල පාර, බඩගමුව, කුරුණෑගල. | කුරුණෑගල |

## ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වරලත් කපු අලෙවිසැල් පිහිටා ඇති ස්ථාන

| අනු අංකය | වරලත් කපු අලෙවිසැල් | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 1. | රන්දිය පෑට්ස් ඇන්ඩ් නට්ස්, පයාගල, මග්ගොන. | කළුතර |
| 2. | සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ. | ගාල්ල |
| 3. | P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල. | ගාල්ල |
| 4. | ෆ්‍රෙෂ් ෆාම් ෂොප්, ගාලු පාර, හික්කඩුව. | ගාල්ල |
| 5. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට. | කොළඹ |
| 6. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, වැලිසර. | කොළඹ |
| 7. | Ranjanas 7 Stories, අංක 318, ගාලු පාර, කොළඹ 04. | කොළඹ |
| 8. | ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඟුරුවාතොට පාර, හොරණ. | කළුතර |

| අනු අංකය | වරලත් කප්පු අලෙවිසැල් | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 9. | පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමූපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර. | කළුතර |
| 10. | නිව් ඇමරිකන් චිකන් හට්, නො.16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර. | කළුතර |
| 11. | සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39 E, මාතර පාර, අකුරැස්ස. | මාතර |
| 12. | සියුම් ෆුඩ් ප්‍රඩක්ට්ස්, අංක 499, කෙලින් වීදිය, කෑගල්ල. | කෑගල්ල |
| 13 | සීමාසහිත යටිනුවර ගඟපළාත විවිධ සේවා සමූපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය. | මහනුවර |
| 14. | සීමාසහිත යටිනුවර මැද පළාත විවිධ සේවා සමූපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව. | මහනුවර |
| 15. | සීමාසහිත මධ්‍යම පළාත් සමූපකාර සමිතිය, ඇහැලේපොළ කුමාරිහාමි මාවත බෝගම්බර, මහනුවර. | මහනුවර |
| 16. | සීමාසහිත පූජාපිටිය සමූපකාර සමිතිය, පූජාපිටිය. | මහනුවර |
| 17. | සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමූපකාර සමිතිය, මාතලේ පාර, අලවතුගොඩ. | මහනුවර |
| 18. | සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමූපකාර සමිතිය, මැණික්හින්න. | මහනුවර |
| 19. | සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ. | මහනුවර |
| 20. | සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, මාතලේ. | මාතලේ |
| 21. | සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, ලග්ගල. | මාතලේ |
| 22. | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, අංක 21, ගාලු පාර, දෙහිවල. | කොළඹ |
| 23. | උදම්සා කිරිහල, 978 D 3, පන්නිපිටිය පාර, පැලවත්ත. | කොළඹ |
| 24. | තල් සංවර්ධන මණ්ඩලය, ගාලු පාර, බම්බලපිටිය. | කොළඹ |
| 25. | තල් සංවර්ධන මණ්ඩලය, කන්කසන්තුරේ. | යාපනය |
| 26. | තල් සංවර්ධන මණ්ඩලය, නල්ලූර් අසල. යාපනය. | යාපනය |
| 27. | තල් සංවර්ධන මණ්ඩලය, යාපනය. | යාපනය |
| 28. | තල් සංවර්ධන මණ්ඩලය, වව්නියාව. | වව්නියාව |

| අනු අංකය | වරලත් කජු අලෙවිසැල් | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 29. | ඔන්රෝ ෆාමසි, නො.25, නාගොඩ පාර, කටුකුරුන්ද. | කොළඹ |
| 30. | ගෝල්ඩන් මේඩ්, 144, ගාලු පාර, අහංගම. | ගාල්ල |
| 31. | නිව් මෝනිස් බේකරි, ගාලු පාර, මග්ගොන. | කළුතර |
| 32. | කැන්ඩි ලයින්ස්, පාර්ක් රෝඩ්, කෑගල්ල. | කෑගල්ල |
| 33. | සාගර බේකර්ස්, අඟුරුවාතොට පාර, හොරණ. | කළුතර |
| 34. | රෝයි ග්‍රොසරි, මතුගම පාර, කටුකුරුන්ද හන්දිය, කළුතර. | කළුතර |
| 35. | හරිස්චන්ද්‍ර මිල්ස්, වැල්බට් වීදිය, ගාල්ල. | ගාල්ල |
| 36. | ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස්, ජාවත්ත පාර, බම්බලපිටිය. | කොළඹ |
| 37. | Colombo Cricket Club, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07. | කොළඹ |
| 38. | EPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල. | කෑගල්ල |
| 39. | ලයන් ග්‍රොසරි, මාකුඹුර, පන්නිපිටිය පාර, කොට්ටාව. | කොළඹ |
| 40. | DGM Agriculture Dept., මාතර. | මාතර |
| 41. | අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය. | මාතර |
| 42. | තලගල ස්ටෝර්ස්, තලගල. | කොළඹ |
| 43. | කෝප් සිටි, කුණ්ඩසාලේ. | මහනුවර |
| 44. | සෙප්කෝ සුපර්, බෝගම්බර. | මහනුවර |
| 45. | DGM Agriculture Dept., ලබුදූව, ගාල්ල. | ගාල්ල |
| 46. | පැනොරාමා චයිනීස් රෙස්ටුරන්ට්, කොට්ටාව. | කොළඹ |
| 47. | Namunukula Dairy Stores, වත්තල. | ගම්පහ |
| 48. | මාස්ටර් ෂොපර්, කොළඹ 01. | කොළඹ |
| 49. | ඉන්ද්‍රා වයින් ස්ටෝර්ස්, හික්කඩුව. | ගාල්ල |
| 50. | විවිධ සේවා සමූපකාර සමිතිය, මහනුවර. | මහනුවර |
| 51. | අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ. | කොළඹ |
| 52. | Vintage Teas, අංගොඩ. | කොළඹ |
| 53. | Dr. Smoothy Cafe, මහනුවර. | මහනුවර |
| 54. | මියුලා ෂොප්, මහනුවර. | මහනුවර |

| අනු අංකය | වරලත් කජු අලෙවිසැල් | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 55. | අවන්හල, මහනුවර. | මහනුවර |
| 56. | DGM Agriculture Dept., තෙලිජ්ජවිල. | මාතර |
| 57. | රෝයල් බේකරි, වැල්ලවත්ත. | කොළඹ |
| 58. | කපුවත්ත මහත්මිය, නාවල. | කොළඹ |
| 59. | බලංගොඩ Food Shop. | රත්නපුර |
| 60. | Royal Mall (Pvt) Ltd, මහනුවර. | මහනුවර |
| 61. | Sasen Milk Bar, රාජගිරිය. | කොළඹ |
| 62. | Sunrise Super, කුණ්ඩසාලේ. | මහනුවර |
| 63. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මැල්සිරිපුර. | කුරුණෑගල |
| 64. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මහබේරියතැන්න. | මහනුවර |
| 65. | ජාතික ත්‍රිපෝෂ ආයතනය. | ගම්පහ |
| 66. | කඩුගන්නාව විවිධ සේවා සමූපකාර සමිතිය. | මහනුවර |
| 67. | නවමිණී (Pvt) Ltd. | කොළඹ |
| 68. | Dairy Products and Milk Bar. | කොළඹ |
| 69. | State Trading Corporation. | කොළඹ |

# 01. ව්‍යාප්ති හා පර්යේෂණ අංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය කජු පාරිභෝජන ඉල්ලුම සපුරාලමින් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරලීමේ භාරදූර වගකීම ප්‍රධාන වශයෙන් පැවරී ඇත්තේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා පර්යේෂණ අංශය වෙතයි. මෙම ක්‍රියාවලිය වඩාත් විධිමත්ව හා ඵලදායීතාවයෙන් යුක්තව සපුරා ගැනීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරිවරයාගේ (ව්‍යාප්ති හා පර්යේෂණ) සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 11ක් හා පර්යේෂණ අංශ 02ක් ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පවතී. මෙම ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත ප්‍රාදේශීය කළමනාකරු, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්ගෙන් සමන්විත 60කට ආසන්න ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයක් මඟින් සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වශයෙන් කජු වගාවේ නියැලී සිටින වගාකරුවන් වෙත අවශ්‍ය තාක්ෂණික උපදෙස් සහ යෙදවුම් ලබා දීම සිදුකරයි. එම කාර්යයන් යටතේ ව්‍යාප්ති හා පර්යේෂණ අංශය විසින් පහත කාර්යයන් සිදුකරනු ලබයි.

- කජු වගාව ව්‍යාප්ත කිරීම සහ වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ගොවීන්හට වගා ආධාර ලබා දීම.
- ගොවීන්ගේ කජු ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු සහ බාධාවන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම සහ සහජීවනය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ඵලදායීතාවය ඉහළ නැංවීම.
- කජු වගාවේ සංවර්ධනය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම හා ඒකාබද්ධව කටයුතු කිරීම.
- කජු මද පිරිසැකසුම් කිරීම, එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් කජු වගාකරුවන් හා කජු පිරිසැකසුම්කරුවන්ගේ අදාළ ක්ෂේත්‍රයේ නිපුණතාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීම් කටයුතු සිදුකිරීම.
- නව කජු ප්‍රභේද හඳුන්වා දීම මඟින් කජු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පර්යේෂණ සිදුකිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී කෘෂි රසායන හා වගා ක්‍රමවේද හඳුන්වා දීම මඟින් කජු වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම.
- කජු ආශ්‍රිත නව අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදුකිරීම.

වාර්ෂිකව ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදනවලට අනුව සහ වැවිලි අමාත්‍යාංශයේ සහ උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මඟපෙන්වීම මත වාර්ෂික සංවර්ධන වැඩසටහන් සැලසුම් කරනු ලබන අතර ඒ අනුව 2021 වර්ෂයේ දී පහත සඳහන් සහනාධාර සහ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

## 1.1 ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

### 1.1.1 කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

2021 වර්ෂයේදී දිස්ත්‍රික්ක 22ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 125ක් පමණ ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 2,365ක් හා බීජ කජු අක්කර 555ක් වගා කරන ලද අතර මෙම සහනාධාර යෝජනා ක්‍රමයේ ගෙවතු වගාව සඳහා අක්කර 1,080ක් සහ පැළ 18,745ක් ලබා දෙන ලදී. මෙම සහනාධාර වැඩසටහන යටතේ පවුල් 5,384ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත. කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය නිසා පැවති සංචරණ සීමා හේතුවෙන් මෙම වැඩසටහන ප්‍රමාද විය.

වගු අංක 1.1 **2021 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද පැළ ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | බද්ධ කජු (අක්කර) | බීජ කජු (අක්කර) | ගෙවතු වගාව | |
|---|---|---|---|---|
| | | | බද්ධ කජු (අක්කර) | බීජ කජු (අක්කර) |
| 1. පුත්තලම | 260 | 30 | 50 | 10 |
| 2. කුරුණෑගල | 150 | 05 | 65 | - |
| 3. හම්බන්තොට | 125 | 20 | 55 | - |
| 4. අනුරාධපුරය | 245 | - | 155 | - |
| 5. අම්පාර | 80 | 220 | 90 | 10 |
| 6. බදුල්ල | 115 | - | 85 | - |
| 7. මහනුවර | - | - | 50 | - |
| 8. රත්නපුර | 30 | 15 | 55 | - |
| 9. මාතලේ | 180 | - | 70 | |
| 10. පොළොන්නරුව | 100 | - | 100 | - |
| 11. මොණරාගල | 285 | - | 15 | - |
| 12. මඩකලපුව | 105 | 90 | 105 | |
| 13. ත්‍රිකුණාමලය | 50 | 40 | 10 | |
| 14. වවුනියාව | 160 | - | 40 | |
| 15. මන්නාරම | 45 | 40 | 10 | - |
| 16. මුලතිව් | 105 | 65 | 10 | - |
| 17. කිලිනොච්චිය | 125 | 25 | 10 | 15 |
| 18. යාපනය | 25 | 05 | 15 | 05 |
| 19. කෑගල්ල | 20 | - | 10 | - |
| 20. ගම්පහ | 100 | - | - | - |
| 21. මාතර | 50 | - | 25 | - |
| 22. ගාල්ල | 10 | - | 15 | - |
| **එකතුව** | **2365** | **555** | **1040** | **40** |

### 1.1.2 සංවර්ධන ව්‍යාපෘති යටතේ පැළ ලබාදීම

රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෘෂි අපනයන ගම්මාන වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා බද්ධ කජු පැළ 100,000ක් සහ කුරුණෑගල, කෑගල්ල මහනුවර, මාතර යන දිස්ත්‍රික්ක සඳහා බද්ධ කජු පැළ 60,000ක් ලබා දීම ඉලක්ක කරගත්

ව්‍යාපෘතිය සඳහා, මේ වන විට බද්ධ පැළ 130,204ක් ලබා දී ඉඩම් සහ ගොවීන් තේරීම 98%ක් පමණ අවසන් කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රතිලාභී ගොවීන් 4264ක් සඳහා පුහුණු සැසි 09ක් පවත්වා සංවර්ධන නිලධාරීන් 478ක් පුහුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය සම්පූර්ණ කර ඇත. මෙම වැඩසටහන සඳහා මුල්‍ය ප්‍රතිපාදන පැළ නිකුත් කිරීම් අවසානයේ දී ලැබීමට නියමිතය. (මෙම ව්‍යාපෘතිය 2022.01.28 දින වන විට අවසන් කිරීමට නියමිත අතර, මුදල් රු.මි. 32.55ක් ලබා දෙන ලදී)

**වගු අංක 1.2 2021 බෙදා දුන් පැළ ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | බෙදා දුන් පැළ ප්‍රමාණය |
|---|---|
| 1. කුරුණෑගල | 28,685 |
| 2. මහනුවර | 321 |
| 3. මාතර | 9,800 |
| 4. හම්බන්තොට | 40,158 |
| 5. කෑගල්ල | 25,000 |
| 6. වවුනියාව | 1,240 |
| 7. රත්නපුරය | 5,000 |
| 8. පුත්තලම | 20,000 |
| **එකතුව** | **130,204** |

### 1.1.3 කජු වගා සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීම

බද්ධ කජු වගා කිරීම සඳහා අක්කරයකට රු 9,500/-ක මුදලක් සහ බීජ කජු වගා කිරීම සඳහා අක්කරයකට රු 3,500/-ක් වශයෙන් මෙම සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත. එසේ වුවද, මෙම වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් මෙම කාර්යය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. වර්තමානයේදී සහනාධාර වැඩසටහන යටතේ තෝරාගත් ගොවීන්හට ගොවි පුහුණුව සහ තාක්ෂණය ලබා දීම ඇතුළු අනෙකුත් ව්‍යාප්ති සේවාවන් නොමිලයේ ලබා දෙන අතර, වගා භූමි ප්‍රමාණයට අවශ්‍ය රු.250.00ක් වටිනා බද්ධ කජු පැළ සහ රු.125.00ක් වටිනා බීජ කජු පැළ නොමිලයේ ලබා දීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 11ක් හරහා කජු වගා කරනු ලබන දිස්ත්‍රික්ක 22ක් තුළ සිදුකරනු ලබයි.

### 1.1.4 පර්යේෂණ හා සංවර්ධන කටයුතු

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය, බද්ධ කිරීමේ විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, බද්ධ හා බීජ කජු වගාව, පැළ ඝනත්වය, පසු අස්වනු තාක්ෂණය, අස්වැන්න සහ අතුරුභෝග වගාව ආදී විවිධ වූ දිශානතීන් අනුව අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මඟින් මෙම වැඩසටහන් සඳහා මඟපෙන්වීම හා ප්‍රගතිය ඇගයීම සිදු

කරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සේවා ජාලය මඟින් උපදේශන සේවා ලබා දීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා, වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මඟින් ගොවීන් වෙත ලබා දෙන ලදී.

මීට අමතරව ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර සහ කෘමිනාශක ආනයනය කිරීම සීමා කිරීම නිසා මෙම වර්ෂයේ රසායනික පොහොර සහ කෘමිනාශක මිලදී ගැනීමේ කටයුතු සිදු නොකළ අතර, කාබනික පොහොර නිෂ්පාදන කටයුතු සිදු කර ඇත. ගොවීන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පුහුණුව හා තාක්ෂණය ගොවි පුහුණු වැඩසටහන්වලදී ලබාදුන් අතර, එය මාර්ගගත ක්‍රමය ඔස්සේ සාර්ථකව සිදු කරන ලදී. මෙම වර්ෂයේදී කමන්දළුව වතුයායේ කොම්පෝස්ට් පොහොර මෙට්‍රික් ටොන් 10.0ක් නිෂ්පාදනය කිරීම සිදුකර ඇත.

## 1.1.5 ඵලදායීතාවය ඉහළ නැංවීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය සඳහා නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් භාවිතයෙන් Good Agricultural Practices (GAP) ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් "හෙලෝපෙල්ටිස්" ආසාදනය සහ කඳ හා මුල් විදින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා අදාල නීතිමය තත්ත්වයන් හමුවේ පැවැත්වීමට නොහැකි වූ අතර පුහුණු වැඩසටහන් 02ක් පමණක් පැවැත්වීමට හැකිවිය.

## 1.1.6 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.1.7 ලෝක ආහාර වැඩසටහනෙහි (WFP) ප්‍රතිපාදන මත දිස්ත්‍රික්ක 05ක ක්‍රියාත්මක "සෞභාග්‍යා" කජු වගා ව්‍යාපෘතිය

මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල, මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිලාභීන් 580ක් සඳහා බද්ධ කජු පැළ 11,600ක් බෙදා දී අවසන් කර ඇත. මේ සඳහා ප්‍රතිපාදන රු.මි. 2.9ක් ලැබී ඇත.

# 02. වැවිලි අංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය කජු පාරිභෝජන ඉල්ලුම සපුරාලීමට දායක වෙමින් කජු කර්මාන්තය නඟාසිටුවීම උදෙසා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ එක් ප්‍රධාන අංශයක් වන වැවිලි අංශය විසින් සැලකිය යුතු කාර්යභාරයක් සිදුකරනු ලබයි.

කජු සංස්ථාවේ වැවිලි අංශය මඟින් ලබාදෙන දායකත්වය මඟින් දේශීය පාරිභෝජනය සඳහා ගුණාත්මක තත්ත්වයෙන් උසස් කජු නිෂ්පාදනය වීමට අමතරව දිස්ත්‍රික්ක 22ක් තුළ විහිදී ඇති කජු වගාව සිදුකරනු ලබන සුළු හා මහා පරිමාණ කජු වගාකරුවන් වෙත තම කජු වගාව සාර්ථකව හා ලාභදායීව පවත්වා ගැනීමට අවශ්‍ය වන උපදෙස් හා මඟපෙන්වීම් ලබාදීමද සිදුකරනු ලබයි. ඉහත සඳහන් කාර්යයන් සිදුකිරීම සඳහා දිවයින පුරා වතුයායන් 08ක් හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන (Planting Material Production Centers) හෙවත් බීජ උද්‍යාන 05ක් පිහිටා ඇත.

වැවිලි අංශය යටතේ ක්‍රියාත්මක වන තවත් එක් ප්‍රධාන කාර්යභාරයක් වන්නේ දිවයින පුරා විසිරී සිටින කජු ගොවීන් සඳහා අව්‍යාජ (Authentic) කජු බද්ධ පැළ සැපයීමයි. මේ සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි වාණිජ තවාන් 08ක් පිහිටා ඇත. මෙම වාණිජ පැළ තවාන්වල ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධව සිදුකරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දී ඇති කජු ප්‍රභේදවලින් වාණිජව නිෂ්පාදනය කර, කජු ගොවීන් වෙත බද්ධ කජු පැළ ලෙස ලබා දීම සිදුකරයි. ඒ අනුව 2021 වර්ෂයට අදාලව ප්‍රභේද 11ක පැළ නිෂ්පාදනය කර ඇති අතර එම ප්‍රභේද පහත පරිදි වේ.

**<u>වගු අංක 2.1</u> 2021 වර්ෂයේ දී නිෂ්පාදනය කර ඇති ප්‍රභේදයන්**

| ප්‍රභේදයේ නම | |
|---|---|
| WUCC -1 | WUCC -13 |
| WUCC -2 | WUCC -16 |
| WUCC -5 | WUCC -19 |
| WUCC -7 | WUCC -21 |
| WUCC -8 | WUCC -23 |
| WUCC -9 | - |

මෙහිදී කජු සංස්ථාවේ ව්‍යාප්ති අංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික ව්‍යාප්ති වැඩසටහන් මඟින් මෙන්ම එක් එක් වර්ෂවල ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩසටහන් යටතේ ගොවීන් අතරට මෙම ප්‍රභේදවල කජු පැළ ලබා දීම සිදුකරයි.

ඊට අමතරව මෙම එක් එක් තවාන්වලින් එම ප්‍රදේශවල ජනතාව සඳහා කජු පැළ මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් ද සපයා ඇත.

ඒ අනුව වතු අංශය මඟින් සිදු කෙරෙන කාර්යභාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

- සංස්ථාව සතු වතුයායන් නඩත්තු කරමින් ලාභදායීව පවත්වාගෙන යාම.
- වතුයායන්වල නව වගාව ඇති කිරීම හා පැරණි වගාවන් පුනරුත්ථාපනය කිරීම.
- වාණිජ තවාන් වාර්ෂිකව ස්ථාපිත කර අව්‍යාජ (Authentic) බද්ධ පැළ නිෂ්පාදනය සිදුකිරීම.
- නව කජු වගාකරුවන් හා ව්‍යවසායකයින් සඳහා කජු වගාව සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම, පුහුණුව හා කජු වගාව සම්බන්ධයෙන් අවශ්‍ය වෙනත් තොරතුරු සැපයීම.
- කජු වගා ආදර්ශ පවත්වාගෙන යාම මඟින් ගොවීන් සඳහා දැනුම ලබා දීම.
- කජු වගාව තුළ අතුරු භෝග වගා කිරීම තුළින් අමතර ආදායම් ලබා ගැනීම.
- වගාකරුවන්ට, නව ව්‍යවසායකයින්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, රාජ්‍ය හා පෞද්ගලික_ආයතනවල සේවකයන් වෙත, කෘෂිකාර්මික සංවිධානවල සාමාජිකයන් වෙත කජු කර්මාන්තය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් වැඩසටහන් සිදුකිරීම.

ඉහත ක්‍රියාකාරකම් විධිමත්ව හා ඵලදායීතාවයෙන් යුක්තව සපුරාගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ වැවිලි අංශයේ සහකාර සාමාන්‍යාධිකාරි - වැවිලිගේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකරණ සහකාර නිලධාරී මණ්ඩලයක් සේවය කරනු ලබන අතර, සංස්ථාව යටතේ පවතින වතුයායන් 08හි, බීජ උද්‍යාන (රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන) 05හි හා පැළ තවාන් 08හි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වතු අධිකාරීවරු, ස්ථානභාර නිලධාරීවරුන් හා ඔවුන්ගේ අධීක්ෂණය යටතේ නිලධාරී මණ්ඩලයක් රාජකාරී කටයුතු සිදුකරනු ලබයි. තවද එක් එක් වතුයායන්, තවාන් හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවලට අනුයුක්තව කම්කරුවන් 200ට ආසන්න ප්‍රමාණයක් සේවය කරනු ලබයි. 2021 වර්ෂයේ දී වතු අංශය විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 2.1 වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම

### 2.1.1 වතු සංවර්ධනය

වතු අංශය මඟින් 2021 වර්ෂය තුළදී ප්‍රධාන වතුයායන් / බීජ උද්‍යාන 13ක් පවත්වාගෙන යනු ලැබිණි. මෙම වතුයායන් හා බීජ උද්‍යාන පිහිටි දිස්ත්‍රික්කය හා මුළු අක්කර ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**වගු අංක 2.2 2021 වර්ෂයේදී පවත්වාගෙන යන ලද වතු / බීජ උද්‍යාන**

| වතුයාය | පිහිටි දිස්ත්‍රික්කය | මුළු අක්කර ප්‍රමාණය |
|---|---|---|
| 1. කමන්දළුව වතුයාය | පුත්තලම | 548 |
| 2. ආච්චිගෙවත්ත වතුයාය | පුත්තලම | 961 |
| 3. හාඩි වතුයාය | මඩකලපුව | 365 |
| 4. කොණ්ඩච්චි වතුයාය | මන්නාරම | 6498 |
| 5. මාන්කර්ණි වතුයාය | මඩකලපුව | 1075 |
| 6. පුනරීන් වතුයාය | කිළිනොච්චිය | 479 |
| 7. වෙල්ලන්කුලම වතුයාය | මන්නාරම | 500 |
| 8. තිරියාය වතුයාය | ත්‍රිකුණාමලය | 10 |
| 9. එළුවන්කුලම වතුයාය /බීජ උද්‍යානය | පුත්තලම | 651 |
| 10. මහඔය බීජ උද්‍යානය | අම්පාර | 81 |
| 11. සුදුවතුර ආර බීජ උද්‍යානය | මොණරාගල | 200 |
| 12. විලච්චිය බීජ උද්‍යානය | අනුරාධපුරය | 25 |
| 13. නාලන්ද බීජ උද්‍යානය | මාතලේ | 135 |
| **එකතුව** | | **11,528** |

## 2.1.2 වතු පුනරුත්ථාපනය

2021 වර්ෂයේ දී වෙල්ලම්කුලම වත්තේ කැළය සමඟ පැවති අක්කර 100ක කජු වගාවේ කැළය සුද්ද කර පුරප්පාඩු පැළ යොදා ප්‍රතිස්ථාපනය කරන ලදි. මීට අමතරව කමන්දළුව, එළුවන්කුලම, පුනරීන්, කොණ්ඩච්චි යන වතුයායන්වල පැවති වගාවේ පුරප්පාඩු පැළ සිටුවා එම වතු ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කර ඇත.

## 2.1.3 ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම

මේ යටතේ මහඔය, විලච්චිය, එළුවන්කුලම, සුදුවතුරආර හා නාලන්ද යන බීජ උද්‍යානය 05ක් පවත්වාගෙන යන ලදි. මෙම බීජ උද්‍යාන නඩත්තු කිරීම මඟින් බද්ධ පැළ නිෂ්පාදනය කර විධිමත් පරිදි බෙදා හරින ලදි.

**වගු අංක 2.3 2021 වර්ෂයේදී පැළ නිෂ්පාදනය**

| පැළ තවානේ නම | නිපදවන ලද බද්ධ පැළ | නිපදවන ලද බීජ පැළ |
|---|---|---|
| 1. කමන්දළුව | 156,145 | - |
| 2. දඹුල්ල | 33,187 | - |
| 3. මිහින්තලේ | 139,612 | - |
| 4. මහියංගනය | 78,842 | - |
| 5. කුඹුක්කන | 31,145 | - |
| 6. හාඩි | 24,260 | 6,510 |
| 7. චන්ද්‍රිකා වැව | 38,443 | - |
| 8. මංගලගම | 9,596 | 10,850 |
| **එකතුව** | **511,230** | **17,360** |

2021 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද මෙම බීජ පැළ 17,360ක ප්‍රමාණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ විධිමත් පරිදි බෙදාහරින ලදී.

- **රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

  සංස්ථාවේ කප්සු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවල (PMPC) ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ 799,785ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ බද්ධ කිරීමට අවශ්‍ය බීජ පැළ නිෂ්පාදනයට යොදා ගන්නා අතර මව්ගස්වලින් ලබාගත් අංකුර 800,000ක ප්‍රමාණයක් බද්ධ කිරීමට යොදා ගන්නා ලදී.

- **තවාන් කළමනාකරණය**

  සංස්ථාවේ වතු අංශය යටතේ පවතින මධ්‍යම පැළ තවාන්වලින් වැඩි දියුණු කළ නව ප්‍රභේදවලින් බද්ධ පැළ 511,230ක් පමණ නිෂ්පාදනය කර, එම බද්ධ පැළ සංස්ථාවේ වතුයායන්වලට හා සහනාධාර වැඩසටහන් යටතේ පෞද්ගලික වතු හිමියන් සඳහා හා රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා විධිමත් පරිදි බෙදා දී ඇත.

**වගු අංක 2.4 2021 වර්ෂයේ වතුයායන්/ බීජ උද්‍යානයන්හි කප්සු අස්වැන්න**

| වතුයාය | කප්සු අස්වැන්න (ක්ෂේත්‍ර බර) කි.ග්‍රෑම් | කප්සු අස්වැන්න (වියළි බර) කි.ග්‍රෑම් |
|---|---:|---:|
| 01. එළුවන්කුලම | 38,496 | 34,184 |
| 02. කමන්දළුව | 20,610 | 17,249 |
| 03. නාලන්ද | 193 | 165 |
| 04. හාඩි | 6,230 | 5,801 |
| 05. පුත්තලම | 8,549 | 7,281.7 |
| 06. මහඔය | 2,613 | 2,339 |
| 07. මාන්කර්ණි | 1,108 | 1,032 |
| 08. විලච්චිය | 334 | 299.8 |
| 09. කොණ්ඩච්චිය | 6,532 | 5,864 |
| 10. සුදුවතුරආර | 315 | 259 |
| 11. පුනරීන් | 18,465 | 16,332 |
| 12. වෙල්ලන්කුලම | 17,293 | 15,247 |
| 13. තිරියාය | - | - |
| **එකතුව** | **120,738** | **106,053.5** |

මීට අමතරව සංස්ථාවේ වතුයායන්වල අතුරු භෝගයක් වශයෙන් වගා කළ පොල් වගාවේ 2021 වර්ෂයේ අස්වැන්න පහත පරිදි වේ.

**වගු අංක 2.5 2021 වර්ෂයේ වතුයායන්වල පොල් අස්වැන්න**

| වතුයාය | පොල් අස්වැන්න |
|---|---|
| 01. කමන්දළුව | 43,602 |
| 02. හාඩි වතුයාය | 5,811 |

## 2.2 වතුයායන්වල නව වගාව

2021 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ පුත්තලම වතුයායේ අක්කර 25ක පැළ සිටුවීම ආරම්භ කර ඇත. එසේම එළුවන්කුලම බීජ උද්‍යානයේ කජු අක්කර 20ක්, කමන්දළුව වතුයායේ පොල් අක්කර 25ක් වගා කරන ලදි. මීට අමතරව මෙම වතුයායන්ගේ නව වගාව සහ පැරණි වගා නඩත්තු කටයුතු සාර්ථකව සිදුකරන ලදි.

## 2.3 කොණ්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපනය කිරීම

මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටි අක්කර 6,498කින් යුත් කොණ්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, කජු වගාව සහ කජු වගාව පදනම් කරගත් සංචාරක කර්මාන්තයක් (Agro Based Eco Tourism) ආරම්භ කිරීම සඳහා මූලික වැඩකටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2021 වර්ෂයට අදාල විශේෂ අයවැය ප්‍රතිපාදන යටතේ වතුයාය ප්‍රතිස්ථාපන කටයුතු සඳහා රු.මි. 125ක් සහ ජල සම්පාදන කටයුතු සංවර්ධනය සඳහා රු.මි. 100ක් ලෙස රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රු.මි. 225ක් ලබාදෙන ලදී. කොණ්ඩච්චි වතුයායේ වගා කිරීමට ඇති අක්කර 4,000ක පමණ ප්‍රමාණයෙන් 2020 වර්ෂයේදී ස්ථාපිත කරන ලද භූමි ප්‍රමාණය අක්කර 131ක් වන අතර ඉතිරි අක්කර 3,869ක ප්‍රමාණයෙන් 2021 වර්ෂයේ ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියට අදාල අක්කර 1000ක භූමි ප්‍රමාණයෙන් වර්ෂ අවසානයේදී නව වගාව සඳහා කැලෑ එළිකිරීම් අක්කර 125ක් පමණ සිදුකර ඇති අතර, ව්‍යාපෘතිය සඳහා ඉතිරි භූමි ප්‍රමාණය එළිකිරීම් සිදුකරමින් පවතී. කොණ්ඩච්චි වතුයාය සඳහා විදුලිය ලබා ගැනීමේ ඇස්තමේන්තු ලබා ගෙන ඇති අතර ඒ සඳහා රු.මි 23ක් ගෙවීමට කටයුතු සිදුකරන ලද අතර, විදුලි රැහැන් ඇදීම සඳහා සලකුණු කර ඇත. වතුයාය අලින්ගෙන් ආරක්ෂාකර ගැනීම සඳහා විදුලි වැට ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් මූලික ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. වතුර බවුසර් 15ක් නිෂ්පාදනය අවසන් කර, වතුයායට ලබා දීමට සූදානම් කරන ලදි. කොණ්ඩච්චි වතුයායේ යුධ සමයේදි හානි වූ ගබඩා 01ක්, ශාලා 02ක් සහ නිවාස 05ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික කටයුතු සිදුකරන ලදි .

වතුයායේ සම්පූර්ණ ඉලක්ක ගත භූමි ප්‍රමාණය වගා කිරීම සඳහා පැළ නිෂ්පාදනය සම්පූර්ණ කර ඇත. වතුයායේ ට්‍රැක්ටර් අවශ්‍යතාවය සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින්

භාවිත කරන ලද ට්‍රැක්ටර් රථ 16ක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් පවරා ගැනීම් කටයුතු සිදුවෙමින් පවතී.

ආහාර සුරක්ෂිතතාවය වැඩිකිරීම සඳහා, මෙම නව වගා සහ නොමේරූ කජු වගා කර ඇති භූමියේ අතුරු භෝග ලෙස වට්ටක්කා, පුහුල්, කැකිරි හා උඳු වගාව අක්කර 120ක පමණ බිම් සකසා වගාව ආරම්භ කර ඇත. මෙහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 54.84කි.



*කොණ්ඩච්චි වතුයායේ බිම් සැකසීම*



*කොණ්ඩච්චි වතුයායේ අතුරු භෝග ලෙස වගාකර ඇති වට්ටක්කා අස්වැන්න*

## 2.4 වතුයායන් සහ තවාන්වල ස්ථාන භාර නිල නිවාස 07ක් ස්ථාපිත කිරීම

රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මෙම නිවාස 07ක් සෑදීම සඳහා අත්තිවාරම් දමා ඇති අතර, බිම් සකසා බිත්ති බැඳීම් කටයුතු සිදුකර ඇත. මේ සඳහා මූල්‍ය පිරිවැය රු.මි 3.5කි. මෙම වැඩසටහන 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

# 03. අලෙවි හා පිරිසැකසුම් අංශය

## හැඳින්වීම

අලෙවි හා පිරිසැකසුම් අංශය විසින් දේශීය කජු පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක තත්ත්වයෙන් යුතු කජු පිරිසැකසුම් කටයුතු සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ කජු පිරිසැකසුම් කටයුතු සිදුකරනු ලබන මධ්‍යස්ථාන 02ක් පවතී. අලෙවි අංශය විසින් සිදුකරනු ලබන සමස්ත කාර්යභාරය පහත ලෙස සංක්ෂිප්තව දැක්විය හැකිය.

- නිෂ්පාදන පිරිවැය අවම කිරීමත්, ඵලදායීතාවය ඉහළ නැංවීමත් මඟින් කජු පිරිසැකසුම් කර්මාන්තය ඉහළ නැංවීම.
- අන්තර්ජාතික ප්‍රමිත තත්ත්වයන්ට ගැළපෙන පරිදි අගය එකතු කළ කජු නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය සහ රසය ඉහළ නැංවීම.
- කජු අලෙවිය සහ පිරිසැකසුම් කර්මාන්තයේ උන්නතිය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින් වාර්ෂිකව 10%ක් ක්ෂේත්‍රයේ එම සංවර්ධනය ඇතිකිරීම.
- ලාභදායීත්වය ඉහළ නංවාගනිමින් සහ වෙළඳපොළ තරඟකරුවන් සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින්, අලෙවි අංශය කාර්යක්ෂමව සහ ඵලදායීතාවයෙන් යුක්තව පවත්වාගෙන යාම.
- සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමත්, කුසලතා සංවර්ධනය කිරීම මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා බලගැන්වීම.

**2021 වර්ෂයේ දී අලෙවි අංශය විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.**

## 3.1 අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

### 3.1.1 ලෙලි කජු මිලට ගැනීම

වෙළඳපොළ තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම හා පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම වර්ෂයේ දී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ලෙලි කජු මෙට්‍රික් ටොන් 54.81ක් මිලදී ගන්නා ලදී. මේ නිසා තරඟකාරී වෙළඳපොළ මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙට්‍රික් ටොන් 106.0ක අස්වැන්න ද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

## 3.1.2 කජු අලෙවිකරණය

ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් දේශීය කජු අතරමැදියන්ගේ මැදිහත් වීමකින් තොරව පාරිභෝගිකයාට සහන මිලට ලබා දීමේ අරමුණින්, 2021 වර්ෂයේ දී අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "Cashew Pub" සංකල්පය යටතේ වෙළඳසැල් නවීකරණය සඳහා විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. එහි සමාරම්භක අවස්ථාවක් ලෙස නාරාහේන්පිට "රජවාස" පරිශ්‍රයේ 2021.02.11 දින සහ වැල්ලවත්ත නගරයේ 2021.01.21 දින ද සංස්ථා අලෙවිසැල් ආරම්භ කරන ලදී. තවද, බලංගොඩ නගරයේ 2021.04.09 දින මෙම සංකල්පය යටතේ තවත් අලෙවිසැලක් ආරම්භ කරන ලදී. මෙම වර්ෂයේ අවසාන කාර්තුවේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් පැල්මඩුල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් බඩගමුව යන නගරවල කජු අලෙවිසැල් ආරම්භ කරන ලදී. තවද දිවයිනේ ප්‍රධාන නගරවල මෙම සංකල්පය යටතේ කජු අලෙවිසැල් ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. මීට අමතරව නව වරලත් අලෙවිසැල් 06ක් මේ වන විට ආරම්භ කරන ලදී.

නව තාක්ෂණික ක්‍රම භාවිතය, අගය එකතු කිරීම හා උසස් කජු නිෂ්පාදන අලෙවි කිරීම මඟින් රු.මිලියන 92.12ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.




*නාරාහේන්පිට "රජවාස" පරිශ්‍රයේ සංස්ථා කජු අලෙවිසැල ආරම්භ කිරීමේ සමාරම්භක අවස්ථාව*





*වැල්ලවත්ත නගරයේ සංස්ථා කජු අලෙවිසැල ආරම්භ කිරීමේ සමාරම්භක අවස්ථාව*

## 3.2 කජු පිරිසැකසුම් කර්මාන්තය ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය පූර්ණ යාන්ත්‍රීකරණය සඳහා උපකරණ මිලදී ගැනීම් කටයුතු හා අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. මෙමඟින් කජු පිරිසැකසුම් ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. තවද, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සංස්ථාව සඳහා ස්වයංක්‍රීය කජු ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගෙන නැඳගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත.

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මඟින් ඉහළ මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම්කරුවන් පුහුණු කිරීමත්, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සහාය වීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබා දීම සිදුකරන ලදී.

2021 වර්ෂයේදී පුත්තලම සහ නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානවල ලෙලි කජු මෙ.ටොන් 134.7ක් පිරිසැකසුම් කරන ලද අතර, අගය එකතු කරන ලද කජු මද මෙ.ටොන් 26.8ක් අලෙවි කර රු.මි. 92.12ක ආදායමක් ලබාගෙන ඇත.





*පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය සඳහා මිලදී ගත් කජු කපන යන්ත්‍රය*

 

## 3.3 කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම

2021 වර්ෂයේ දී උසස් තත්ත්වයේ අගය එකතු කරන ලද කජු මද මෙ.ටොන් 26.26ක් ජාත්‍යන්තර වෙළඳපොලට ඉදිරිපත් කිරීම මඟින් රු. මිලියන 89.07ක විදේශ විනිමය ඉපැයිමට ශ්‍රී ලංකාව සමත්විය. එසේම 2020 වර්ෂයේදී කජු මද මෙට්‍රික් ටොන් 34.31ක් අපනයනය කිරීමෙන් රු.මි. 81.13ක විදේශ විනිමයක් උපයාගෙන ඇත. මේ අනුව 2021 වර්ෂයේ දී අපනයන ධාරිතාවය සංසන්දනාත්මකව අඩු අගයක් ගනී. මේ සඳහා ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපෑ අතර, දේශීය සංචාරක කර්මාන්තයේද සීඝ්‍ර පසුබෑමත් සමඟ කජු මද සඳහා පවතින ඉල්ලුම ද අඩු විය.

| ඉතුරුම් | 8,830,408.49 | 149,821,932.80 |
| | **42,516,220.25** | **159,875,737.30** |

## 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| වෙනස්වීම් | මූලික ප්‍රාග්ධනය (රු) | රාජ්‍ය ප්‍රාග්ධනය (රු) | වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන | ප්‍රාග්ධන සංචිත (රු.) | ලාභාලාභ ගිණුම (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|
| 2020.01.01 දිනට ශේෂය | 40,000,000.00 | 202,788,511.45 | 15,766,347.27 | 17,441,846.85 | (141,197,261.12) | 134,799,444.45 |
| පෙර වර්ෂයට අදාල ගැලපුම් | - | - | - | - | 2,444,558.88 | 2,444,558.88 |
| වර්ෂය තුලදී ලද ප්‍රදාන | - | 84,650,000.00 | 16,941,000.00 | - | - | 101,591,000.00 |
| ලාභ අලාභ ගිණුමට මාරු කිරීම | - | (31,057,088.95) | (369,786.87) | - | - | (31,426,875.82) |
| මුළු ශුද්ධ ආදායම | - | - | - | - | (10,885,646.81) | (10,885,646.81) |
| | - | - | - | - | - | - |
| 2020.12.31 දිනට ශේෂය | **40,000,000.00** | **256,381,422.50** | **32,337,560.40** | **17,441,846.85** | **(149,638,349.05)** | **196,522,480.70** |
| 2021.01.01 දිනට ශේෂය | 40,000,000.00 | 256,381,422.50 | 32,337,560.40 | 17,441,846.85 | (149,638,349.05) | 196,522,480.70 |
| පෙර වර්ෂයට අදාල ගැලපුම් | - | - | - | - | 2,302,852.99 | 2,302,852.99 |
| වර්ෂය තුලදී ලද ප්‍රදාන | - | 64,000,000.00 | 255,253,204.84 | - | - | 319,253,204.84 |
| ලාභ අලාභ ගිණුමට මාරු කිරීම | - | (30,846,497.29) | (854,581.20) | - | - | (31,701,078.49) |
| මුළු විස්තීරණ ආදායම | - | - | - | - | (19,729,633.18) | (19,729,633.18) |
| **2021.12.31 දිනට ශේෂය** | **40,000,000.00** | **289,534,925.21** | **286,736,184.04** | **17,441,846.85** | **(167,065,129.24)** | **466,647,826.86** |

# 07. ශ්‍රී ලංකා කජු සංස්ථාව

**වර්ෂ 05 ක ගිණුම් සාරාංශය** **රු.(000)**

| | 2021 Rs. | 2020 Rs. | 2019 Rs. | 2018 Rs. | 2017 Rs. |
|---|---|---|---|---|---|
| ලාභ ලාභ ගිණුම | | | | | |
| ශුද්ධ විකුණුම් | 139,223 | 109,120 | 100,082 | 94,931 | 100,951 |
| විකුණුම් පිරිවැය | 99,661 | (72,190) | (67,857) | (61,023) | (80,182) |
| දළ ලාභය | **39,562** | **36,930** | **32,225** | **33,908** | **20,769** |
| අනෙකුත් ආදායම් | 42,727 | 43,300 | 48,343 | 10,544 | 15,522 |
| පුනරාවර්තන ප්‍රදාන | 64,800 | 60,000 | 60,000 | 15,077 | 18,700 |
| පරිපාලන වියදම්/අනෙකුත් වියදම් | (160,419) | (147,982) | (167,334) | (38,407) | (38,893) |
| ක්‍රමක්ෂය | (3,082) | (3,134) | (3,420) | 539 | 244 |
| **වාණිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය** | **(16,412)** | **(10,886)** | **(30,186)** | **21,661** | **16,342** |
| **සේවා අංශය- ආදායම් ඉක්ම වු වියදම්** | **-** | **-** | **-** | **(61,303)** | **(58,678)** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(16,412)** | **(10,886)** | **(30,186)** | **(39,642)** | **(42,336)** |
| **ශේෂ පත්‍රය** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 117,553 | 77,883 | 82,027 | 87,369 | 89,363 |
| ඵල දරන වගා නඩත්තුව | 28,053 | 31,135 | 34,270 | 27,436 | 22,870 |
| ඵල නොදරන වගා නඩත්තුව | 71,592 | 60,329 | 37,862 | 51,591 | 50,446 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 628 | 576 | 69 | - | 1,726 |
| අනෙකුත් කුඩා ව්‍යාපෘති | 6,363 | 122 | 675 | 523 | 620 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **224,189** | **170,045** | **154,903** | **166,919** | **165,025** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 90,952 | 64,467 | 38,264 | 20,222 | 24,940 |
| වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 47,390 | 18,474 | 21,207 | 17,484 | 19,597 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 43,813 | 9,828 | 6,093 | 2,553 | 3,810 |
| මුදල් හා මුදල් සමාන දෑ | 159,876 | 42,516 | 5,202 | 3,225 | 5,806 |
| **මුළු ජංගම වත්කම්** | **342,031** | **135,285** | **70,766** | **43,484** | **54,153** |
| **මුළු වත්කම්** | **566,220** | **305,330** | **225,669** | **210,403** | **219,178** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| මූලික ප්‍රාග්ධනය | 40,000 | 40,000 | 40,000 | 40,000 | 40,000 |
| රාජ්‍ය ප්‍රදාන | 289,535 | 256,381 | 202,788 | 175,414 | 143,996 |
| අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන | 286,736 | 32,337 | 15,766 | 17,756 | 18,143 |
| ප්‍රාග්ධන සංචිත | 17,442 | 17,441 | 17,442 | 17,442 | 17,442 |
| ලාභාලාභ ගිණුම | (167,065) | (149,638) | (141,197) | (110,011) | (70,311) |
| **මුළු හිමිකම්** | **466,648** | **196,521** | **134,799** | **140,601** | **149,270** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම් | 42,948 | 38,953 | 35,046 | 27,704 | 27,335 |
| දිගුකාලීන ණය | 3,500 | 3,500 | 3,500 | 3,500 | 3,500 |
| **මුළු ජංගම නොවන වගකීම්** | **46,448** | **42,453** | **38,546** | **31,204** | **30,835** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ ණයහිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 53,124 | 66,359 | 52,324 | 38,598 | 39,073 |
| **මුළු ජංගම වගකීම්** | **53,124** | **66,359** | **52,324** | **38,598** | **39,073** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | **566,220** | **305,333** | **225,669** | **210,403** | **219,178** |
| ශුද්ධ වත්කම් ප්‍රතිලාභය % | (3.5%) | (5.5) | (22.4) | (28.2) | (28.3) |
| ශුද්ධ ලාභ අනුපාතය % | 11.8% | (9.98) | (30.2) | (41.8) | (41.9) |
| ජංගම අනුපාතය | 6.4 | 2.0 | 1.4 | 1.1 | 1.4 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 4.7 | 1.1 | 0.4 | 0.6 | 0.7 |
| මුළු ආදායමට මුළු වියදම | 0.93 | (0.89) | (1.3) | (1.2) | (0.8) |

# 08. 2021 වර්ෂය සඳහා කාර්යය සාධන වාර්තාව

## 8.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

### 8.1.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 3405 ක් හා බීජ කජු අක්කර 595 ක් වශයෙන් මුළු අක්කර 4000 ක් දිස්ත්‍රික්ක 22 ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 5384 ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. 2021 වර්ෂයේදී මෙම සහනාධාර වැඩසටහන යටතේ විශේෂයෙන් ගෙවතු වගාව සඳහා ද පැළ ලබදෙන ලදී. ගොවි පුහුණු වැඩසටහන් 19 ක් පැවැත්වූ අතර ගොවීන් 228 ක් මේ සඳහා සහභාගී විය. මෙම වර්ෂයේදීත් පැවති කොරෝනා වසංගත රෝගී තත්ත්වය යටතේ වුවද මෙම කජු සහනාධාර වැඩසටහනේ ඉලක්ක සාර්ථකව නිමකිරීමට හැකියාව ලැබිණි. මේ සඳහා වැයවූ මුදල රු.මි.14.76 කි.

## 8.2 වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම

### 8.2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ගොවි ජනතාවට හඳුන්වාදී ඇති විවිධ ප්‍රදේශවලට උචිත නව කජු ප්‍රභේද කජු සංස්ථාවට අයත් කමන්දළුව හා හාඩි වතුයායන් වල පිහිටි වාණිජ තවාන් වලින් හා අමතරව මිහින්තලේ, චන්ද්‍රිකා වැව, දඹුල්ල, මංගලගම හා කුඹුක්කන යන ප්‍රදේශවල පිහිටි වාණිජ තවාන් වලින් නිෂ්පාදනය කර, කුඩා කජු ඉඩම්හිමියන් වෙත ලබාදීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, මඩකලපුව දිස්ත්‍රික්කයේ මාන්කර්ණි, මන්නාරම දිස්ත්‍රික්කයේ කොණ්ඩච්චි, සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුරආර යන ශාක අභිජනන මධ්‍යස්ථාන නඩත්තු කරමින් පවත්වාගෙන යන ලදී. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන් සඳහා බද්ධ පැළ නිෂ්පාදනය සඳහා ඉහළ ගුණාත්මකින් යුතු මවුබීජ 799,785ක් හා අංකුර 800,000 ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 14.53 කි.

## 8.2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිත යෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් "හෙලෝපෙල්ටිස්" මකුණාගේ රෝග ආසාදනය සහ කඳ හා මුල් විදින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් පවත්වා ඇති අතර ඒ සඳහා ගොවීන් 100 ක් සහභාගී විය.

## 8.2.3 පැළ තවාන් කළමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 08 ක් කමන්දළුව වතුයායේ හා අළුත්තරම, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල, මංගලගම හා කුඹුක්කන ප්‍රදේශ වල පිහිටා ඇත. මෙම මධ්‍යම පැළ තවාන්වල ස්ථිර තවාන් ගෘහ සැකසීම සඳහා වැඩකටයුතු ආරම්භ කර ඇත. මෙම තවාන්වල 2021 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 511,230 ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී. මේ සඳහා වැයවූ මුදල රු. 15.52 කි.

## 8.2.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා පැළ ලබාදීම

2021 වර්ෂයේදී උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලිභෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** යටතේ බද්ධ කජු පැළ 100,000 ක් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහාද, බද්ධ කජු පැළ 60,000 ක් කුරුණෑගල, කෑගල්ල, මහනුවර, මාතර යන දිස්ත්‍රික්ක සඳහාද බෙදාදෙන ලදී. මෙම වැඩසටහනේ ප්‍රතිලාභී ගොවීන් 4264 ක් සඳහා පුහුණු සැසි 09 ක් පවත්වා ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 32.55 ක් රේඛිය අමාත්‍යාංශය මගින් ලබාදී ඇත.

මෙම ව්‍යාපෘතියට අමතරව ලෝක ආහාර වැඩසටහනෙහි ප්‍රතිපාදන මත (WFP) **"සෞභාග්‍යා"** ව්‍යාපෘතිය මගින් මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල, මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ප්‍රතිලාභීන් 580 ක් සඳහා බද්ධ කජු පැළ 11,600 ක් නිකුත් කර ඇත. මේ සඳහා රු.මි. 2.9 ක් ලැබී ඇත.

## 8.3 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ ඝනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සේවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. 2021 වර්ෂයේ පැවති කොරෝනා රෝගී වසංගතය තත්ත්වය මධ්‍යයේ වුවද, රසායනික පොහොර හා කෘමිනාශක ආනයනය සීමා කිරීම හේතුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් කමන්දළුව වතුයායේ සිදුකරන ලදී. මෙම වැඩසටහන යටතේ කොම්පෝස්ට් පොහොර මෙ.ටොන් 10.0 ක් නිෂ්පාදනය කරන ලදී. මෙයට අමතරව ගොවීන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහනක් මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ සාර්ථකව සිදුකරන ලදී. වතුයායන්ගේ කෘමි හා පළිබෝධ මර්දනය සඳහා කෘමිනාශක ලබාගැනීමට විශේෂ අනුමැතියක් ලබාගැනීම සඳහා කටයුතු සිදුකරන ලදී. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්වල මුල්‍ය ප්‍රගතිය රු.මි. 2.69 කි.

## 8.4 සංස්ථා වතුයායන්වල නව වගාව හා වගා පුනරුත්ථාපනය

මෙම වැඩසටහන යටතේ පුත්තලම වතුයායේ අක්කර 25 ක කජු පැළ සිටුවීම ආරම්භ කරන ලදී. ඒසේම එළුවන්කුලම බීජ උද්‍යානයේ කජු අක්කර 20 ක්, කමන්දළුව වතුයායේ පොල් අක්කර 10 ක් හා හාඩි වතුයායේ කජු අක්කර 25 ක් වගා කිරීමට මූලික වැඩකටයුතු සිදුකරමින් පවතී.

මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි කොණ්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු සඳහා උක්, බඩඉරිඟු,කජු,ගම්මිරිස්, කුරුඳු,කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලිභෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මුල්‍ය ප්‍රතිපාදන රු.මි 225. 0 ක් ලබාදෙන ලදී.

සංස්ථා වතුයායන්වලින් මෙට්‍රික් ටොන් 106 ක ලෙලිකජු අස්වැන්නක් ලබා ගන්නා ලදි. මීට අමතරව ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස රසායනික පොහොර යෙදීම, වල් මර්ධන කටයුතු, රෝග හා පළිබෝධ මර්ධනය, ක්ෂේත්‍ර මාවත් නඩත්තු කිරීම කප්පාදු කිරීම ආදී ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකරන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 19.63 කි.

## 8.5 පසු අස්වනු තාක්ෂණය

### 8.5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලද ලෙලි කජු අස්වැන්න සහ කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මිලදීගත් කජු මද පුත්තලම සහ නැඳගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. ඒවා අගය එකතුකල නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවිසැල් 69 කින් සමන්විත සංස්ථා අලෙවිසැල් ජාලයක් උපයෝගී කරගන්නා ලදි. 2021 වර්ෂයේ කජු මද අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු.මි. 92.12 කි.

## 8.6 මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී. මෙමගින් කාර්යය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසුණු අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉඩ ප්‍රස්ථාව සැලසුනි. 2021 වසර තුළ සේවකයින්ගේ හැකියාව සහ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව හා මඟපෙන්වීම යටතේ සංස්ථා කාර්ය මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කළමනාකරණ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා වැයවූ මුදල රු.මි. 0.18 කි.

# 09. ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

**01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**

**02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම**

**03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය**

**04. මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.**

## 01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

### 1.1 ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි දේශගුණික කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03 ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000 ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 7000 කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 3000 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර ගෙවතු වගාව යටතේ වර්ෂයකට අක්කර 1000 ක් පමණ වගා කිරීමට ද සැලසුම්කර ඇත.

### 1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන් වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. මේ යටතේ උතුරු පළාතේ කොන්ඩච්චි වතුයාය, නැගෙනහිර පළාතේ මාන්කර්ණි වතුයාය සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු සංස්ථාව විසින් සිදුකරගෙන යනු ලබයි. මේ වන විට කොණ්ඩච්චි වතුයායේ අක්කර 1500 ක් පමණ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සංවර්ධනය කරන ලද අතර අක්කර 500 පමණ

ප්‍රමාණයක් සංස්ථාව විසින් සංවර්ධන කටයුතු සිදුකරන ලදී. 2020 වර්ෂයේ සිට කොණ්ඩච්චි වතුයායේ ඉතිරි අක්කර 4000 ක පමණ ප්‍රමාණයක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව වගා කිරීමට සැලසුම් සකස්කර ඇත.

## 1.3 නව වගාව

පෞද්ගලික, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් හිමියන් සතු කජු වගාවන්වල නව වගාවද වාර්ෂිකව අක්කර 500 පමණ සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 7000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 11 කින් සමන්විත ව්‍යාප්ති සේවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 22 ක කජු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

## 1.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා කජු පැළ ලබාදීම

2021 වර්ෂයේදී උක්,බඩඉරිඟු,කජු,ගම්මිරිස්, කුරුඳු,කරාබුනැටි,බුලත් ඇතුළු කුඩා වැවිලිභෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මුල්‍ය ප්‍රතිපාදන මත **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** යටතේ බද්ධ කජු පැළ 100,000 ක් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහාද, බද්ධ කජු පැළ 60,000 ක් කුරුණෑගල, කෑගල්ල, මහනුවර, මාතර යන දිස්ත්‍රිකක සඳහාද බෙදාදෙන ලදී. මෙම වැඩසටහනේ ප්‍රතිලාභී ගොවීන් 4264 ක් සඳහා පුහුණු සැසි 09 ක් පවත්වා ඇත.

මෙම ව්‍යාපෘතියට අමතරව ලෝක ආහාර වැඩසටහනෙහි ප්‍රතිපාදන මත (WFP) **"සෞභාග්‍යා"**ව්‍යාපෘතිය මගින් මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල, මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ප්‍රතිලාභීන් 580 ක් සඳහා බද්ධ කජු පැළ 11,600 ක් නිකුත් කර ඇත.

මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ඉදිරි වර්ෂ වලදීද ක්‍රියාත්මක කිරීම තුලින් කජු වගා වපසරිය ඉහළ නැංවීම මෙහි මුලික අරමුණක් වේ.

# 02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 166000 ක් පමණ වන අතර, මින් 88% ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන්වල

මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස් වල වයස අවුරුදු 20-35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කිලෝ ග්‍රෑම් 3-5 ක් අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරන ලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි රටවල ගසකින් කිලෝ ග්‍රෑම් 10-15 ත් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

## 2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කල නව ප්‍රභේද 11 ක් සංස්ථාව විසින් ගොවීන්වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 1, WUCC 2, WUCC 5, WUCC 7, WUCC 8,WUCC 9, WUCC 13, WUCC 16, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 11ක් එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය හා සුදුවතුර ආර යන වතුයායන් හා ශාක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවල වගා කර ඇත. මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද නිෂ්පාදනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කිලෝ ග්‍රෑම් 1000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## 2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන පැරණි බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (Good Agricultural Practices) කජු වගාවේ අස්වනු ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිළි කළමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදීද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත වේ.

මේ නිසා කජු අස්වැන්න 30%-40% ත් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, අළුත්තරම, කුඹුක්කන, හාඩි වතුයාය හා චන්ද්‍රිකාවැව හා මංගලගම යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ. වාර්ෂිකව බද්ධ පැළ 300,000 ක් පමණ නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුළදීද වසරකට පැළ 300,000 බැගින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

## 03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලි කජු මෙට්‍රික් ටොන් 10000 - 12000 ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය මද පරිභෝජනයද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 3,500/- ත් රු. 4,500/- ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

## 3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලීකරණ යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

## 3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ

නියැලෙන්නන් 50 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling machine) හා විජලීකරණ යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුමිලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාක්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## 3.3 ලෙලි කජු හා කජු මද මිලදී ගැනීම

සංස්ථා වතුයායන් වලින් ලැබෙන ලෙලි කජු අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය කජු මද සිවිල් ආරක්ෂක දෙපාර්තුව මගින් මිලදී ගැනීම පසුගිය වසර තුලදී සිදුකරන ලදී. සංස්ථාවට අයත් කොණ්ඩච්චි වතුයායේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් අක්කර 935 ක පමණ කජු වගාකර ඇති අතර, එම කජු වෙළඳපොල මිලට වඩා අඩු මිලට සංස්ථාවට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් කජු සංස්ථාවට ලබා දෙනු ලැබේ. වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම සහ පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම කජු මිලදී ගැනීම සිදුකරන ලදී. ඉදිරි වර්ෂ 03 තුලදීද මෙම මිලටගැනීමේ කටයුතු සිදුකිරීමට නියමිතයි.

## 3.4 කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන්කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් ටොන් 120,000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. මෙම කජු පුහුලන් භාවිතකර Non Alcoholic Beverages ජෑම්, කෝඩියල් වැනි අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව කජු සහ මී පැණි මිශ්‍ර කජු නිෂ්පාදනයන් නිකුත් කිරීම සහ මසාලා රසැති කජු නිෂ්පාදනය කිරීම පිලිබඳ පර්යේෂණ කටයුතු සාර්ථකව සිදුකරනු ලැබේ.

## 4.0 මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම

## 4.1 මානව සම්පත් පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙමගින් කාර්යය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්ය සාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවළියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සිදුකල අතර, ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

ඒ අනුව කාර්ය මණ්ඩල ව්‍යුහය තුල සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලිකාංග සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තරාතිරම්වල කාර්ය සාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

# 10. කාර්යය සාධනය පිළිබඳ වර්ෂ 05 ක සාරාංශය

| | විස්තරය | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|
| 01 | සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද කජු අක්කර ප්‍රමාණය | සහනාධාර වැඩසටහ 2,920<br>ගෙවතු වගාව 1,080<br>එකතුව 4000 | සහනාධාර වැඩසටහන 2568<br>ගෙවතු වගාව 932<br>එකතුව 3500 | සහනාධාර වැඩසටහන 3305<br>ගෙවතු වගාව 1195<br>එකතුව 4500 | සහනාධාර වැඩසටහන 3305<br>ගෙවතු වගාව 1195<br>එකතුව 4500 | 4500 |
| 02 | සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව | 5384 | 7676 | 11069 | 11818 | 14932 |
| 03 | නිෂ්පාදනය කරන ලද පැළ ගණන | බද්ධ පැළ 511,230<br>බීජ පැළ 17,360<br>**එකතුව 528,590** | බද්ධ පැළ 422570<br>බීජ පැළ 54500<br>එකතුව **477570** | බද්ධ පැළ 270294<br>බීජ පැළ 79945<br>එකතුව **350239** | බද්ධ පැළ 197353<br>බීජ පැළ 80007<br>එකතුව **277360** | බද්ධ පැළ 328456<br>බීජ පැළ 105480<br>එකතුව **433936** |
| 04 | එක්රැස් කරන ලද මව්බීජ සංඛ්‍යාව | 799,785 | 500,000 | 500,000 | 484,753 | 560,000 |
| 05 | එක්රැස් කරන ලද අංකුර ප්‍රමාණය | 800,000 | 520,000 | 310,000 | 164,500 | 200,000 |
| 06 | ලබාගත් අස්වැන්න (මෙට්‍රික් ටොන්) | 106.0 | 149.46 | 157.81 | 83.52 | 66.4 |
| 07 | සංස්ථා වතුයායන්වල නව වගාව(අක්කර) | 90 | 346 | 52.5 | 65 | 433 |
| 08 | සංඛ්‍යාව වරලත් අලෙවිසැල් සංඛ්‍යාව | 69 | 74 | 56 | 60 | 56 |

| | විස්තරය | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|
| 09 | තාක්ෂණ හුවමාරු වැඩසටහන්, පළිබෝධ පාලනය සහ පසු අස්වනු තාක්ෂණය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 30 | 82 | 166 | 139 | 197 |
| 10 | පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව | 663 | 1369 | 2320 | 3550 | 3574 |
| 11 | ආනයනය කරන ලද කජු ප්‍රමාණය (මෙ.ටොන්) | ලෙලි කජු 0.051<br>කජු මද 0.047 | ලෙලි කජු 549.2<br>කජු මද 0.025 | ලෙලි කජු 527.26<br>කජු මද 0.826 | ලෙලි කජු 2378.02<br>කජු මද 156.41 | ලෙලි කජු 2108.22<br>කජු මද 160.82 |
| 12 | කජු ආනයන බලපත්‍ර නිකුත් කරන ලද මෙ. ටොන් ප්‍රමාණය | - | 500 | - | 4255 | 6000 |
| 13 | කජු අපනයනය කරන ලද ප්‍රමාණය මෙ.ටොන් | 26.26 | 34.32 | 47.40 | 60.81 | 59.04 |
| 14 | කජු අපනයනය කරන ලද වටිනාකම (රු.මි) | 89.07 | 81.13 | 93.57 | 144.62 | 143.51 |
| 15 | ලෙලි කජු සහ කජු මද මිලදී ගැනීම (මෙ.ටොන්) | ලෙලි කජු 54.8<br>කජු මද - | ලෙලි කජු 64.<br>කජු මද - | ලෙලි කජු 20.0<br>කජු මද 2.30 | ලෙලි කජු -<br>කජු මද 5.3 | ලෙලි කජු 63.0<br>කජු මද 4.8 |

| | විස්තරය | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|
| 16 | අගය එකතු කරන ලද කජු මද විකුණු ප්‍රමාණය (මෙ.ටොන්) | 26.8 | 16.91 | 21.72 | 24.74 | 27.80 |
| 17 | අගය එකතු කරන ලද කජු මද විකුණු වටිනාකම (රු.මි) | 92.12 | 47.23 | 79.08 | 83.15 | 87.96 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊආර්අයි/ඩී/එස්එල්සීසී/එෆ්ජී/2021/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 ඔක්තෝබර් 20 දින

සභාපති
ශ්‍රී ලංකා කජු සංස්ථාව

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

11.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 15 වගන්තිය අනුව සංස්ථාව විසින් විලම්භිත බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 12 වගන්තිය ප්‍රකාරව වර්ෂයට අදාළ රු.486,025 ක මෝටර් රථ අලුත්වැඩියා වියදම ලාභාලාභ ගිණුමට හර කිරීම වෙනුවට සදොස් ලෙස රු.360,625 ක් මෝටර් රථ ගිණුමට හර කර ඒ සඳහා රු.72,125ක ක්ෂය කිරීමක් කර තිබුණි. ඉතිරි රු.125,400 සදොස් ලෙස පෙර වර්ෂයේ ගැලපීමක් ලෙස හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ සමුච්චිත ලාභයට හර කර තිබුණි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57(ඇ) වගන්තිය ප්‍රකාරව ආයුගණක ලාභය/අලාභය (Actuarial gain/loss) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,874,309 ක් වූ ආයුගණක අලාභය, රු. 3,317,449 ක් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 135 (ආ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම (Defined Benefit Plans) සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක් ඉදිරිපත් කළයුතු අතර එහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලී ආදායම හෝ වියදම, සමාලෝචිත වර්ෂයට අදාළව සිදු කරන ලද ගෙවීම් සහ ආයුගණන ප්‍රතිලාභ ලාභය/ අලාභය යනාදී අයිතමයන් වෙන් වශයෙන් දැක්විය යුතුය. නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව වර්ෂය සඳහා වියදම(ප්‍රවර්තන සේවා පිරිවැය හා පොලී වියදම), වර්ෂය තුළ ගෙවීම්, ආයුගණක (ලාභය) / අලාභය යන සංරචක සඳහා හෙළිදරව් කරන ලද වටිනාකම් සහ ආයුගණක තක්සේරු වාර්තාවෙහි සඳහන් වටිනාකම් අතර වෙනස්කම් තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 139 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ රු.42,948,044 ක ශේෂයට අනුරූපීව ආයෝජනයක් සිදු කර නොතිබුණි.

(ඊ) 2019 හා 2020 වර්ෂවලදී මෝටර් රථ 04 ක් වෙනුවෙන් දරන ලද රු.1,356,220 ක අලුත්වැඩියා වියදම එම වර්ෂවලදී ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ඒ සඳහා වූ රු.271,244 ක ක්ෂය වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් අඩු කිරීමට සිදුවී තිබුණි.

(උ) සංස්ථාවේ ණය කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්ම වූ රු.6,133,121 ක වෙළඳ ණයගැති ශේෂය සඳහා අඩමාන ණය වෙන්කිරීම රු.216,499 ක අඩු වටිනාකමක් ගෙන තිබුණි.එම වෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුළත් කොළඹ ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.1,797,788 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට රු.9,466,200 ක කජු පැළ ලබාදී වසර 09 ක් ගත වී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිකම නිරීක්ෂණය කෙරේ.

(එ) 2018 වර්ෂයේ සිට වෙනත් ණයගැතියන් සඳහා හානිකරණ අලාභ ලෙස සෑම වර්ෂයකම රු.2,106,184 ක එකම අගයක් පවත්වා ඇතත් එම අගය වාර්ෂිකව යාවත්කාලීන කිරීමක් හෝ අගයන් කපාහැරීමක් හෝ වෙනත් පියවරක් ගෙන නොතිබුණි. වසර 02 ට වැඩි වෙළඳ ණයගැති ශේෂයන් වූ ආයතන දෙකකින් අයවිය යුතු රු.103,730 ක මුදල මෙම හානිකරන අලාභය තුළ ඇතුළත්ව තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය

සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) , (ඉ) ,(ඊ) හා (ඌ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා අදාළ බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබුණි.එහෙත් මූල්‍ය ප්‍රකාශනවල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය | ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2023 ජුනි 23 දිනට රු.1,530,165 ක් වූ විගණන ගාස්තු නිරවුල් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2012 ජූලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ | සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති කජු වගා කරන ඉඩම් අක්කර 11,363 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2021 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය සමඟ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 66 ඡේදය | මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, විගණකාධිපතිට ද පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2023 මැයි 03 දිනදීය. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කොන්ඩච්චි වතුයාය ප්‍රතිසංස්කරණය යටතේ අලි වැට ඉදිකිරීම, ට්‍රැක්ටර් හා ජල බවුසර් මිලදී ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම යන ප්‍රධාන කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලද රු.225,000,000 ක මුදලින් 2021 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාවේ වතුවල නඩත්තු කටයුතු සඳහා, වැටුප් ගෙවීම සඳහා සහ ලෙලි කජු මිලදී ගැනීම සඳහා රු.17,557,500 ක් භාවිතා කර තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) නිලධාරීන්ගේ හා සේවකයින්ගේ වෘත්තීය සමිති හා සුභසාධක සංගම්වල දායක මුදල ලෙස වැටුපෙන් අඩු කල රු.1,443,002 ක වාරික මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම සංගම්වලට බැර නොකර සංස්ථාවේ ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ලෙලි කජු, කජු මද හා කජු පැළ ඒකක පිරිවැය ගණනය කිරීමේදී පිළිගත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ගිණුම් වාර්තාවල දක්වා තිබෙන රු.86,531,160 ක් වූ අවසන් තොග වටිනාකම නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය.

(ඈ) 2017 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්‍වා අලාභය රු.134,000,000 සිට රු.112,900,000 දක්වා පරාසයක් ගෙන තිබුණි. මේ අනුව සංස්ථාවේ අඛණ්ඩ මෙහෙයුම් අලාභ, කාර්යමණ්ඩල පුරප්පාඩු වැනි හේතු මත සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය යාන්ත්‍රිකරණය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද එම යන්ත්‍ර සූත්‍ර තොගයෙන් රු.2,870,000 ක පිරිවැයක් දරා යන්ත්‍ර සූත්‍ර කොටසක් පමණක් මිලදීගෙන තිබුණි. අවශ්‍ය සියලුම යන්ත්‍ර මිලදී නොගැනීමෙන් යාන්ත්‍රීකරණ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් අසාර්ථක වීම හේතුවෙන් මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර අභාවිතයේ පැවතුණි.

(ඉ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී කජු තැම්බීමේ ක්‍රියාවලිය නතරවීම හේතුවෙන් ලෙලි කජු තැම්බීමකට (boil) ලක්කර සියයට 90 ත් 95 ත් අතර ප්‍රමාණයෙන් ලබා ගත හැකිව තිබුණු නිෂ්පාදන ඵලදායිතාවය සියයට 70ත් 80ත් අතර ප්‍රමාණයක් දක්වා පහත වැටී තිබුණි. ඒ හේතුවෙන් කජු මද විකිණීමෙන් ලබාගත හැකිව තිබුණු ආදායම සියයට 15ත් 20 ත් අතර ප්‍රමාණයකින් අහිමි වී තිබුණි.

(ඊ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම් හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 සැප්තැම්බර් මස රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රීය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. එම අංශයෙන් දිනකට නිමැවුම කි. ග්‍රෑ 100 ට අඩු නිෂ්පාදනයක් වන අතර එයින් උපරිම වශයෙන් පැකට් 200-300 ත් අතර ප්‍රමාණයක් සකස් කරනු ලැබේ.ඒ සඳහා ගතවන්නේ විනාඩි 04 - 05 ත් අතර කාලයකි. ඒ අනුව මිලදීගත් යන්ත්‍රය අධි ධාරිතාවයෙන් යුත් එකක් බව නිරීක්ෂණය කෙරේ.

(උ) ක්‍රියාකාරී සැලැස්මට අනුව කජු අලෙවිසැල් 07 ක් ඉදිකිරීමට සැලසුම් කර ඇතත් ඒ සඳහා නිර්මාණ සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සකස් කිරීම හෝ ඉදිකරන ස්ථාන පිළිබඳ වෙළඳපොළ අධ්‍යනයක් සිදු කර නොතිබුණි. එම ඉදිකිරීම සඳහා වූ ඉඩම් පවරා ගැනීම හෝ බද්දට ලබා ගැනීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම සමස්ත යෝජනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද ගෙන නොතිබුණි. මෙම ක්‍රියාවලිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීම වෙනුවට සමාජ මාධ්‍ය ජාලවල පල කර තිබුණු දැන්වීම් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 75 ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කර තිබුණි. ඉදිකිරීම් සිදු කරන ලද නාරාගේන්පිට කජු අලෙවිසැල සඳහා රු.3,475,000 ක්ද වැල්ලවත්ත කජු අලෙවිසැල සඳහා රු.950,000 ක්ද ඉදිකිරීම් වෙනුවෙන් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබූ අතර ඒවායේ අවසාන බිල්පත් ගෙවීමේදී රඳවා ගැනීමක්ද සිදු කර නොතිබුණි.

(ඌ) ස්ථාන භාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට උක්, බඩඉරිඟු, කජු,ගම්මිරිස්,කුරුඳු,කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.15,653,000 ක මුදලක් වෙන් කර නිල නිවාස 07 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. එහිදි ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැව පැළ තවානෙහි ඉදිකිරීමට යෝජිත නිල නිවාසය වෙනුවට

අනුමැතියකින් තොරව එය පුත්තලම වතුයායේ නිල නිවාසය ඉදිකිරීම ලෙස වෙනස් කර තිබුණි.මෙම ඉදිකිරීම් සඳහා වූ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු 2021 දෙසැම්බර් 31 වන විටත් පත්කර නොතිබුණු අතර අනුමැතියකින් තොරව වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා විසින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවීමක් කරන ලෙස ස්ථාන භාර නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇතත් ඒ සම්බන්ධ ලිපිගොනුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(එ) 2017 වර්ෂයේදී පුත්තලම (ආච්චිගේ වත්ත) වතුයායේ ඇලෙන් ඉහළ කොටස අක්කර 100 කට වැඩි ප්‍රමාණයක කජු පැළ 7,995 ක් සිටුවා ඇතත්, 2020 වර්ෂයේදී එහි තිබුණු අතුරු බෝග වගාව අත්හැර දැමීම සහ ඉන්පසු සංස්ථාව විසින් කජු වගාව නඩත්තු නොකිරීම හේතුවෙන් කජු පැළ වර්ධනය හීන වී ඵලදාව අහිමි වී තිබුණි.

(ඒ) උක්, බඩඉරිඟු, කජු,ගම්මිරිස්,කුරුඳු,කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මන්නාරම, කොන්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය සඳහා අවස්ථා තුනකදී එකතුව රු.225,000,000 ක් ලබාදී 2021 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබුණද එදින වන විට රු.62,831,734 ක් වියදම් කර ශේෂය වූ රු.162,168,266 ක් නිෂ්කාර්ය ලෙස පැවතිණි.

(ඔ) මන්නාරම කොන්ඩච්චි වතුයාය සඳහා ජල බවුසර් 14 ක් හා රෝද හතරේ ට්‍රැක්ටර් එන්ජින් 14 ක් මිලදී ගැනීමට රු.35,000,000 ක මුදලක් උක්, බඩඉරිඟු, කජු,ගම්මිරිස්,කුරුඳු,කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී ඇතත් ට්‍රැක්ටර් මිලදී ගැනීමකින් තොරව රු.20,775,000 ක් වැයකර ජල බවුසර් 15 ක් මිලදීගෙන තිබුණි. එම මිලදීගත් ජල බවුසර් සඳහා වූ පිරිවිතරයන්ට අනුව, අශ්ව බල 4.5 ක් හා මිනිත්තුවකට ලීටර් 600 ක ධාරිතාවයෙන් යුත්, ISO සහතිකය සහිත වතුර පොම්පයක් ජල බවුසරයට ඇතුළත් විය යුතු වුවත් ඊට පටහැනිව අශ්ව බල 3 ක් හා මිනිත්තුවකට ජලය ලීටර 450 ක ධාරිතාවයෙන් යුත් ISO සහතිකය නොමැති වතුර පොම්ප සපයා තිබුණි. ට්‍රැක්ටර් මිලදී නොගෙන ජල බවුසර් භාවිතාකළ නොහැකිවීම හේතුවෙන් ජල බවුසර් මිලදී ගැනීමට වැය කර ඇති මුදල් නිෂ්කාර්ය වී තිබුණි. එසේම කොන්ඩච්චි වතුයායේ වගාවන් ආරම්භ කොට නොමැති නිසා ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජල බවුසර් 15 න් 7 ක් පුත්තලම ආච්චිගේ වත්ත, කමන්දලුව ,එළුවන්කුලම ,පූනරීන් ,වෙල්ලන්කුලම ,හාඩි , තිරියාය යන වතු යායන් වෙත ලබාදී තිබුණි.

(ඕ) මන්නාරම කොන්ඩච්චි ව්‍යාපෘති ප්‍රදේශය වටා කිලෝමීටරයක දිගකින් යුත් අලි වැටක් ඉදිකිරීම සඳහා වෙන් කර තිබුණු රු.12,000,000 ක මුදලින් අලි වැට ඉදිකිරීම සඳහා ලී පදම් කිරීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමට හා සිවිල් ආරක්ෂක නියාමකයින් සඳහා ආහාර දීමනාව ලබාදීම සඳහා අවස්ථා 3 කදී රු.2,196,090 ක වියදමක් දරා ඇති නමුත් අලි වැට සම්බන්ධ ඉදිකිරීමක් සිදු කර නොතිබුණි.

(ක) මන්නාරම කොන්ඩච්චි වතු ව්‍යාපෘතිය සඳහා විදුලි බලය ලබා ගැනීමට විදුලි බල මණ්ඩලයෙන් ලද රු.23,640,042 ක ඇස්තමේන්තුවක් සඳහා මුදල් ගෙවා ඇතත් විදුලි මනුව ස්ථාපිත කිරීමට ගොඩනැගිල්ලක් නොමැති හෙයින් මණ්ඩලයට විදුලිය ලබාදීමට නොහැකිව තිබුණි. ඇස්තමේන්තුව වලංගුව පවතින 2021 දෙසැම්බර් 31 දිනට පෙර විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට ක්‍රියා කර නොතිබුණි. එසේම

ගොඩනැගිලි සංවර්ධනයකින් හෝ ඉදිකිරීමකින් හෝ සැපයුම ලබා ගැනීමේ සූදානමකින් තොරව, ගොඩනැගිලි සඳහා විදුලි සම්බන්ධතාවය ඉල්ලුම් කර තිබීම කළමනාකරණ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.

(ග) මන්නාරම කොන්ඩච්චි වතු ව්‍යාපෘතියේ අංගයක් ලෙස ඇතුළත් නොවූ වෙනත් පරිබාහිර කාර්යයක් වන සෙවණදැල් මිලදී ගැනීම සඳහා අවස්ථා 4 කදී රු.2,494,200 ක මුදලක් වැයකර සෙවණදැල් මිලදී ගෙන තිබුණු අතර අදාළ ගෘහයද ඉදිකර නොතිබුණි.

(ඝ) එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ලෙලි කජු මිලදී ගැනීම සඳහා 2014 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක ණය මුදල හා ඊට අදාළ පොලිය සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කජු වගා කර ඇති බිම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 3,449ක් වී තිබුණි. එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු.26,732,691ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කජු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.

(ඩ) සංස්ථාව සතුව බැංකු ජංගම ගිණුම් 06 ක් වූ අතර ඒවා ලංකා බැංකුව (ජා-ඇල), මහජන බැංකුව(නුගේගොඩ) යන ශාඛාවන්වල පැවති ජංගම ගිණුම් දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක වී නොමැති අතර ඒවායේ වර්ෂ අවසාන ශේෂ පිළිවෙලින් රු. 15,593ක් හා රු.7,750 ක් විය. තවද සංස්ථාවේ ඉතිරිකිරීමේ බැංකු ගිණුම් 05 ක් පැවති අතර ඉන් ග්‍රාමීය සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව (නුගේගොඩ) ශාඛාවන්වල පැවති බැංකු ගිණුම් දෙකක් දීර්ඝකාලයක සිට ක්‍රියාකාරී තත්වයේ නොපැවතුණි. එම ගිණුම්වල වර්ෂ අවසාන ශේෂ පිළිවෙලින් රු.30,757 ක් හා රු.252,858 ක් වී තිබුණි.එම අක්‍රීය ගිණුම් 04 වසා දැමීමට පියවරගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# 12. විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග

**<u>ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම්.</u>**

1.2 (අ) එකඟ වෙමි.

අදාල පාර්ශවයන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් මෙම විලම්බිත බදු නිවැරදිව ගණනය කර ඒ හා සම්බන්ධ ගැලපීම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ආ) එකඟ වෙමි.

මෙම විගණන ඡේදය යටතේ සඳහන් ප්‍රාග්ධනිත කර ඇති රු. 360,625/-ක වාහන අලුත්වැඩියා වියදම්, ඒ මත ගණනය කර ඇති රු. 72,125/-ක ක්ෂය හා රු. 125,400/-ක කලින් ගෙවූ වියදම් සම්බන්ධයෙන් සිදුවී ඇති ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

1.2 (ඇ) එකඟ වෙමි.

මෙහි ඉදිරිපත් කර ඇති පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාල ආයුගණක අලාභය සම්බන්ධයෙන් වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස තවදුරටත් හඳුනා ගතයුතු රු. 1,556,860/-ක අගය සම්බන්ධයෙන් අදාල ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

1.2 (ඈ) එකඟ වෙමි.

2021.12.31 දිනට ආයුගණක තක්සේරුවට අනුව පාරිතෝෂික වෙන්කිරීම් වගකීම වන රු. 42,948,044/-ක වටිනාකම නිවැරදිව ගිණුම් පොත්වල දක්වා ඇති අතර, කෙසේ නමුත් මෙහි සඳහන් උප වටිනාකම් හි වෙනස්වීම්වලට අදාල ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ කර ඇත.

1.2 (ඉ) එකඟ වෙමි.

මෙම විගණන නිරීක්ෂණයේ දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂයට අනුරූපිව මාසිකව රු. 100,000/-ක් බැගින් වන සේ ආයෝජනයක් සිදුකිරීම සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබාගත් අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කරන ලදුව එම දෙපාර්තමේන්තුව විසින් එම ලිපිය විෂයභාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ද සමඟ නැවත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී.

මේ වන විට විෂයභාර අමාත්‍යතුමාගේ එම අනුමැතිය ද සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත නැවත ලිපියක් යොමු කර ඇති අතර, ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අදාල අනුමැතිය ලද වහාම අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

1.2.(ඊ) එකඟ වෙමි.

මෙහි සඳහන් දැනට ප්‍රාග්ධනීත කර ඇති රු. 1,356,220/-ක අලුත්වැඩියා වියදම් හා ඒ මත 2019 හා 2020 වර්ෂවලදී ගිණුම්ගත කර ඇති රු. 271,244/-ක ක්ෂයවීම් සම්බන්ධයෙන් සිදුකළ යුතු නිවැරදි කිරීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ කර ඇත.

1.2 (උ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් ණය සහන කාලය ඉක්ම වූ සමස්ත එකතුව රු. 6,133,121/-ක් වන වෙළෙඳ ණයගැති ශේෂයෙන් 2023.12.31 දින වනවිට අයකරවාගෙන ඇති මුදල රු. 4,055,036/-කි. ඉතිරි රු.2,078,085/-ක ණයගැති ශේෂය ද කඩිනමින් අයකරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

එසේම මෙම විගණන විමසුමේ දක්වා ඇති රු. 1,797,788/-ක ණයගැති ශේෂය ලිසල එන්ටර්ප්‍රයිසස් නමැති ආයතනයට අදාල වේ. එම ණයගැති ශේෂයෙන් මේවනවිට තවත් රු. 323,378/-ක මුදලක් අයකරවා ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව 2023.12.31 දිනට ලිසල එන්ටර්ප්‍රයිසස් ආයතනයෙන් ලැබිය යුතුව පවතින ණයගැති ශේෂය රු. 1,474,410/-කි. සංස්ථාව මගින් රාජගිරිය පොලීසියේ පැමිණිල්ලක් ගොනු කරමින් අදාල ආයතනයේ අයිතිකරු පොලීසියට කැඳවා කරුණු පැහැදිලි කරදෙමින් ඉහත සඳහන් ණය ශේෂය අයකරවා ගැනීමට දැඩි උත්සාහයක් ගනු ලැබුව ද එය සාර්ථක වී නොමැති බැවින් මෙම ආයතනයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන අදාල

ණය මුදල අයකරවා ගැනීමට සංස්ථා පාලනාධිකාරිය විසින් තීරණය කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට අදාල ණය ගනුදෙනුවල තොරතුරු ඇතුළත් ගොනුව විෂයභාර අමාත්‍යාංශයේ නීති නිලධාරී වෙත යොමු කර ඇත.

එමෙන්ම සංස්ථාවේ වරලත් හා වරලත් නොවන ආයතන වෙත ණය පදනම යටතේ සිදුකරනු ලබන කජු මද ණයට විකුණුම් සඳහා ණය සහන කාලය ඉක්මවා යාමට පෙර අදාල ණය මුදල් අයකරවා ගැනීම ද ඇතුළුව කජු මද ණයට විකුණුම් ගනුදෙනුවලට සමස්ත ක්‍රියාවලිය විධිමත්ව සිදුකිරීම සඳහා නව ක්‍රමවේදයක් පිළිබඳ යෝජනාවලියක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

1.2 (ඌ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් රු. 9,466,200/-ක ණය වටිනාකම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අයකරවා ගැනීමට දැඩි උත්සාහයක් දැරූ නමුත් එය ව්‍යර්ථ විය. මෙම ණය වටිනාකම සම්බන්ධයෙන් 2023.06.15 වන දින පැවති සංස්ථාවේ විගණන කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

එහිදී දැනට ක්‍රියාත්මක නොවන රජයේ අමාත්‍යාංශයකින් ලැබිය යුතුව පවතින මෙම ණය මුදල සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීමට එහිදී නිර්දේශ වූ අතර, මේ සම්බන්ධයෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අදාල ලිපිය යැවීමට කටයුතු කරන ලදී.

ඉහත සඳහන් ලිපිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලැබුනු ප්‍රතිචාර ලිපිය අවශ්‍ය උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් 2023.12.22 වන දින පැවති සංස්ථාවේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, ඒ අනුව මෙම ණය මුදල අයකරවා ගැනීමේ කටයුතු සඳහා තවදුරටත් උපදෙස් ඉල්ලුම් කිරීමට මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යැවීමට තීරණය කරන ලදී. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (එ) පහත අදහස් දක්වමි.

දැනට සංස්ථාව වෙත අයවීමට පවතින එහෙත් හානිකරන අලාභ වෙන්කිරීමක් සිදුකර නොමැති ද්‍රව්‍යාත්මක ණයගැති ශේෂ සම්බන්ධයෙන් ද අවධානය යොමු කර වර්තමාන හානිකරන අලාභ වෙන්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු

කරනු ලබන අතර, එම ගැලපීම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාල පරිදි ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

එසේම මෙම විගණන නිරීක්ෂණයේ තවදුරටත් ඇතුළත් රු. 103,730/-ක අගයක් සහිත දීර්ඝ කාලයක් තිස්සේ අයකරවා ගැනීමට නොහැකිව පවතින ණයගැති ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය යටතේ අනුමැතිය ඉල්ලුම් කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මීට සැලකිය යුතු කාලයකට පෙර ලිපියක් යවා ඇති නමුත් ඒ සඳහා අවසර හිමි නොවූ හෙයින්, ලැබී ඇති උපදෙස් පරිදි අදාල ණයගැතියන් දැනුවත් කර ඉහත සඳහන් ණය මුදල් අයකරවා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ නමුත් මෙතෙක් අදාල කටයුතු සාර්ථක වී නොමැත.

2.2.2 (අ) එකඟ වෙමි.

මේ වන විට අදාල ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කරගෙන යනු ලබන අතර, වර්ෂ සැලකිය යුතු ගණනක ආදායම් බදු වාර්තා ද පිළියෙල කිරීමට පවතින බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවේ. ඒ අනුව හැකි ඉක්මණින් අදාල කටයුතු සම්පූර්ණ කර එම වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ආ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන්ව පවතින රු. 1,530,165/-ක ගෙවිය යුතු විගණන ගාස්තුවලින් රු. 1,065,165/-ක මුදලක් මේවනවිට ජාතික විගණන කාර්යාලය වෙත ගෙවීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව තවදුරටත් ගෙවිය යුතුව පවතින රු. 465,000/-ක මුදල ද හැකි ඉක්මණින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ඇ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන්ව පවතින 2012 ජූලි මස 24 වන දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ලැබෙන අවස්ථාව වනවිට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරාගෙන නොමැති වතුයායන්/ බීජ උද්‍යානයන් හි ඉඩම් අක්කර ප්‍රමාණය 11363ක් නොව අක්කර 2370ක් පමණකි. එහි විශ්ලේෂණය පහත පරිදි වේ.

| වතුයාය / බීජ උද්‍යානය | අයිතිය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. එළුවන්කුලම අදියර I | රජය සතු | පුත්තලම | වනාතවිල්ලුව | 210 |
| 2. ආච්චිගේවත්ත | ඉඩම් ප්‍රතිසංස්කරණ කො.ස. | පුත්තලම | වනාතවිල්ලුව | 961 |
| 3. කමන්දළුව | ඉඩම් ප්‍රතිසංස්කරණ කො.ස. | පුත්තලම | රස්නායකපුර | 548 |
| 4. හාඩි | ඉඩම් ප්‍රතිසංස්කරණ කො.ස. | මඩකලපුව | වාලච්චේන | 365 |
| 5. විලච්චිය | වන සංරක්ෂණ දෙපා. | අනුරාධපුරය | මහවිලච්චිය | 25 |
| 6. සුදුවතුර-ආර | වන සංරක්ෂණ දෙපා. | මොණරාගල | මොණරාගල | 45 |
| 7. මහඔය | වන සංරක්ෂණ දෙපා. | අම්පාර | මහඔය | 81 |
| 8. නාලන්ද | ඇල්කඩුව වැවිලි සමාගම | මාතලේ | මාතලේ | 135 |
| **එකතුව (අක්කර)** | | | | **2370** |

2012 වර්ෂය වනවිට මෙම සංස්ථාවට අයත්ව නොතිබූ එහෙත් පසුකාලීනව විවිධ පාර්ශව වෙතින් සංස්ථාව වෙත ලැබී ඇති නමුත් මෙතෙක් නීතිමය අයිතිය පවරාගෙන නොමැති ඉඩම් අක්කර ප්‍රමාණය 8993ක් වන අතර, එහි විශ්ලේෂණය පහත දැක්වේ.

| වතුයාය /බීජ උද්‍යානය | අයිතිය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ප්‍රමාණය අක්කර | සංස්ථාව වෙත ලැබී ඇති වර්ෂය |
|---|---|---|---|---|---|
| 1. මාන්කර්නි | රජය සතු | මඩකලපුව | කෝරලේ පත්තුව උතුර | 1075 | 2013 |
| 2. කොණ්ඩච්චි | රජය සතු | මන්නාරම | මුසලි | 6498 | 2014 |
| 3. තිරියාය | රජය සතු | ත්‍රිකුණාමලය | ගෝමරන්කඩවල | 35 | 2017 |
| 4. එළුවන්කුලම - අදියර II | රජය සතු | පුත්තලම | වනාතවිල්ලුව | 406 | 2018 |
| 5. පූනරින් | රජය සතු | කිළිනොච්චිය | පූනරින් | 479 | 2019 |
| 6. වෙල්ලන්කුලම | රජය සතු | මන්නාරම | බටහිර මාන්තායි | 500 | 2021 |
| **එකතුව (අක්කර)** | | | | **8993** | |

ඉහත දැක්වෙන පූනරීන්, කොන්ඩච්චි, මාන්කර්නි හා වෙල්ලන්කුලම යන වතුයායන්වල ඉඩම් කොටස් 70 දශකයේ පමණ ශ්‍රී ලංකා කජු සංස්ථාව සතුව පැවතිය ද වසර 30 ක උතුරු - නැගෙනහිර යුධමය වාතාවරණය හේතු කොට ගෙන සංස්ථාවට අහිමිව ගොස් නැවත ඉහත සඳහන් වර්ෂවලදී සංස්ථාව වෙත හිමිවී ඇත.

ඉහත සඳහන් එළුවන්කුලම - අදියර I ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ අයිතිය පවරාදීමට මූලික වශයෙන් රු.මිලියන 25.44ක බදු මුදලක් ගෙවන ලෙසට මෙම සංස්ථාව වෙත දන්වන ලද අතර, එම තක්සේරුව කෘෂිකාර්මික වාණිජ බදු පදනම යටතේ සිදුකළ දළ ගණනය කිරීමක් විය. පසුව නිවැරදි තක්සේරුව මත නැවත එම බදු මුදල රු. මිලියන 11.86ක් ලෙස දන්වන ලද නමුත් එය ද වාණිජ තක්සේරුවක් වූ බැවින් එය නොදියුණු කෘෂිකාර්මික ඉඩම් සඳහා බදු ක්‍රමය යටතේ ගණනය කර ඉදිරිපත්

කරන ලෙසට මෙම සංස්ථාව මගින් ඉල්ලීමක් සිදුකරන ලදී. ඒ අනුව අදාල බදු තක්සේරුව මෙම සංස්ථාව වෙත ලැබිය යුතුව පවතී.

එසේම ඉහත දක්වා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අයිතිය යටතේ පවත්නා පුත්තලම ආච්චිගේවත්ත, කමන්දළුව හා හාඩි යන වතුයායන් හි ඉඩම්වල නීතිමය අයිතිය පවරා ගැනීම සම්බන්ධව 2023.04.11 වන දින එවකට ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී අදාල ඉඩම් කෘෂිකාර්මික පදනම යටතේ නොදියුණු ඉඩම් ලෙස තක්සේරු කර, දීර්සකාලීන බදු පදනම මත මෙම සංස්ථාව වෙත පැවරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් එකඟතාවය ලබාදුන් අතර, ඒ අනුව ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් මේ වන විට සිදුකර ඇත.

එමෙන්ම එළුවන්කුලම - අදියර II, පුනරීන්, කොන්ඩච්චි, තිරියාය, මාන්කර්නි හා වෙල්ලන්කුලම යන රජය සතු ඉඩම් සම්බන්ධයෙන් ද ඉහත රැස්වීමේදී සාකච්ඡා කළ අතර, එම රැස්වීමට සහභාගි වී සිටි ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අදාල ඉඩම් කෘෂිකාර්මික පදනම යටතේ නොදියුණු ඉඩම් ලෙස තක්සේරු කර, දීර්සකාලීන බදු පදනම මත මෙම සංස්ථාව වෙත පවරාදෙන ලෙසට ඉල්ලීමක් සිදුකරන ලෙසට දන්වන ලදී. ඒ අනුව මේ වන විට අදාල ඉඩම් පිහිටි ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඒ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීම් සිදුකර ඇත.

එසේම විලච්චිය, සුදුවතුර-ආර හා මහඔය යන බීජ උද්‍යානවල ඉඩම් සම්බන්ධයෙන් ද දීර්සකාලීන බදු පදනම යටතේ නීතිමය අයිතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරනු ලැබේ.

2.2.2 (ඈ) පහත අදහස් දක්වමි.

ශ්‍රී ලංකා කපු සංස්ථාව සඳහා 2019 වර්ෂය තෙක් අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ සංස්ථාවේ එක් එක් පිරිවැය මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම ශේෂ පිරික්සුම් සකස් කර, එමගින් එක් පිරිවැය මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම අවසාන ගිණුම් පිළියෙල කොට අවසානයේ ඒවා ඒකාබද්ධ කිරීමයි. එමගින් සංස්ථාවේ වාණිජ හා සේවා අංශයන් හි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් අවසාන ගිණුම් පිළියෙල වූ බැවින් එම අංශ සඳහා තීරණ ගැනීමේ කටයුතු ද විධිමත්ව සිදුකිරීමේ හැකියාව පැවතිණි.

2019 වර්ෂය සඳහා ඉහත ක්‍රමවේදයම අනුගමනය කරමින් අවසාන ගිණුම් නියමිත කාල සීමාව තුළදී සම්පූර්ණ කර, විගණන කටයුතු සඳහා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කළ අතර, එම කාර්යාලයේ නිලධාරීන් විසින් අදාල ගිණුම් විගණනය කර කෙටුම්පත් විගණකාධිපති වාර්තාවක් ද සංස්ථාව වෙත යොමු කරන ලදී.

ඉහත කෙටුම්පත් විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව මගින් පිළිතුරු ඉදිරිපත් කළ අතර, එහිදී පිරිවැය මධ්‍යස්ථාන සඳහා එක් එක් ශේෂ පිරික්සුම් වෙනුවට සමස්ථ සංස්ථාව සඳහාම එක් ශේෂ පිරික්සුමක් සකස් කර, එමඟින් අවසාන ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙසට එම නිලධාරීන් විසින් උපදෙස් ලබා දෙන ලදී. කෙසේ නමුත් දීර්ඝ කාලයක් තිස්සේ භාවිත කරන ලද හා ඒ වනතුරු විගණන විමසුම් ඉදිරිපත් වී නොමැති ගිණුම්කරණ ක්‍රමවේදයෙන් බැහැරව ඉහත පරිදි එක් ශේෂ පිරික්සුමක් පිළියෙල කිරිම අපහසු වු හෙයින් 2019 වර්ෂය සඳහා විගණකාධිපති උපදෙස් මත අවසාන ගිණුම් සම්පූර්ණ කිරීමට නොහැකි වු අතර, ඒ අනුව පැරණි අවසන් ගිණුම් කට්ටලය ඉවත්කර ගැනීමට මෙම සංස්ථාවට සිදුවිය.

පසුව නව ක්‍රමවේදය අනුගමනය කරමින් 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර, ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවූ නිසා මෙහි සඳහන් ප්‍රමාදය නිර්මාණය විය.

කෙසේ නමුත් මේ වන විට 2022 වර්ෂය තෙක් සියලු වර්ෂ සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, එම වර්ෂය තෙක් වන සියලු මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනයට භාජනය කොට ඒ මත අවසන් විගණන වාර්තා ද නිකුත් කර ඇත. එසේම 2023 වර්ෂයේ සිට නියමිත කාල රාමුව තුළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු අවසන් කර ජාතික විගණන කාර්යාලය හා අනෙකුත් අදාල රාජ්‍ය ආයතන වෙත එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.2.4 (අ) කොන්ඩච්චි වතුයායේ පවතින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කජු වගා කොටසෙන් ලැබෙන ලෙලි කජු අස්වනු, කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුව මෙම සංස්ථාව වෙත මිලදී ගැනීමට බැඳියාවක් පවතින බැවින් 2021 වර්ෂය තුළදී එම දෙපාර්තමේන්තුව විසින් ඉහත පරිදි එක්රැස් කොටගෙන තිබූ ලෙලි කජු අස්වනු මිලදී ගැනීම සඳහා කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන ප්‍රතිපාදනවලින් අදාල වැයකිරීම් සිදුකර ඇත. කෙසේ නමුත් මේ වන විට එම මුදල් නැවත ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය වෙත පියවීම සිදුකර ඇත.

2.3 (අ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් රු. 1,443,002/-ක වාරික මුදල්වලින් මේ වන විට රු. 1,327,600/-ක මුදලක් (එනම් මුළු අගයෙන් 92%ක්) අදාල සංගම් වෙත ගෙවා අවසන් කර ඇත. සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන මෙහි සඳහන් තත්ත්වය උද්ගතවූ අතර, කෙසේ නමුත් ඉදිරියේදී මෙම වැටුපෙන් සිදුකරන අවකරණයන් අදාල අවස්ථාවේදීම එම සංගම් වෙත ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ආ) පහත අදහස් දක්වමි.

සමාලෝචිත කාලසීමාවට අදාල මුළු පිරිවැය මත පදනම්ව ලෙලි කජු, කජු මද හා කජු පැළවල ඒකක පිරිවැය ගණනය කිරීම සිදුකර ඇති අතර, ඒ මත පදනම්ව ඉහත නිෂ්පාදනයන් හි අවසාන තොගවල පිරිවැය ද ගණනය කර දක්වා ඇත.

අදාල මුළු පිරිවැය තුළ ඇතුලත් විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය සම්බන්ධයෙන් විධිමත් පරිදි වෙන වෙනම අවධානය යොමු කරමින් ඉහත නිෂ්පාදනවල ඒකක පිරිවැයන් ගණනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා අදාල අංශ නියෝජනය වන පරිදි අභ්‍යන්තර නිලධාරී කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මඟින් මේවනවිට මෙහි සඳහන් පිරිවැය ගණනය කිරීම්වල මූලික කටයුතු සම්පූර්ණ කර ඇත. ඒ අනුව හැකි ඉක්මණින් අදාල පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදය සම්පූර්ණ කර, ඒ සඳහා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගෙන් එකඟතාවය ලබා ගනිමින්, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල ක්‍රමවේදය උපයෝගී කොටගෙන අවසන් තොගවල වටිනාකම් ගණනය කර එම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ඇ) පහත අදහස් දක්වමි.

මෙම සංස්ථාව පිහිටුවීමේදී ඊට අදාල වූ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් සංස්ථාව පිහිටුවීමේ අරමුණුවලට අනුව කජු මද හා කජු පැළ අලෙවි කිරීම් වැනි වාණිජ ක්‍රියාකාරකම්වලට අතිරේකව දිවයිනෙහි කජු වගා ව්‍යාප්තිය හා කජු වගාවේ හා පොදුවේ කජු කර්මාන්තයේ කටයුතුවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කළයුතු පර්යේෂණ හා සංවර්ධන කටයුතු යන සේවා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීම ද සංස්ථාව වෙත පැවරී ඇත.

ඉහත සඳහන් කළ පරිදි සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහ පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වන මෙම ආදායම් හා වියදම් ගිණුමක්

පිළියෙල නොකරන අතර, වාර්ෂිකව එම පිරිවැය මධ්‍යස්ථානයන්ට අදාල ද්‍රව්‍යාත්මක අගයකින් යුතු පිරිවැය ද සංස්ථාවේ වාණිජ ක්‍රියාකාරකම්වලට අදාල ලාභ මධ්‍යස්ථානවලට අදාල පිරිවැය සමඟ ඒකාබද්ධ කර ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි.

සංස්ථාවේ ව්‍යාප්ති, පර්යේෂණ හා සංවර්ධන සේවා ක්‍රියාකාරකම්වල විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇති හෙයින් ඒ හරහා සමස්ත ආර්ථිකයට සැලකිය යුතු මූල්‍ය නොවන ප්‍රතිලාභ රාශියක් රැසක් හිමි වී ඇතත්, පවතින ගිණුම්කරණ ක්‍රමවේදය අනුව එම ප්‍රතිලාභ ගිණුම්ගත කිරීමක් සිදුකළ නොහැකි හෙයින් මෙම විගණන නිරීක්ෂණයේදී එම තත්ත්වය සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම වැදගත් වන බව සඳහන් කළයුතු වේ.

කෙසේ නමුත් සංස්ථාවේ විකුණුම් හා අනෙකුත් ආදායම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත.

මෙලෙස ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේදී මෙම සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලවලට අනුව රු. මිලියන 14.47ක ශුද්ධ ලාභයක් උපයා ඇත.

2.3 (ඇ) පහත අදහස් දක්වමි.

මේ සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවන්ට අනුව මේ වන විට රු. මිලියන 7.8කට ආසන්න වටිනාකමකින් යුක්ත යන්ත්‍රසූත්‍ර අයිතම සංස්ථාවේ පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය වෙත ලැබී ඇති බවට තහවුරු වී ඇත.

මෙම විගණන නිරීක්ෂණය යටතේ සඳහන්ව ඇති ප්‍රසම්පාදනයට මූලික වශයෙන් කජු බොයිලේරුවක්, කජු පිරිසැකසුම් යන්ත්‍රයක් හා කජු විජලන යන්ත්‍ර 02ක් පැවති අතර, ඉන් සංස්ථාව මඟින් ඇණවුම් කරන ලද්දේ කජු පිරිසැකසුම් යන්ත්‍රය හා කජු විජලන යන්ත්‍ර දෙක පමණකි. අදාල කාල වකවානුව තුළ දිවයිනෙහි පැවති උද්ධමනකාරී වාතාවරණය හේතු කොට ගෙන ඉහත කී කජු විජලන යන්ත්‍ර සැපයීම සිදුකළ නොහැකි බවට අදාල සැපයුම්කරු වන සහේෂ් ඉන්ඩස්ට්‍රීස් ආයතනය විසින් දන්වන ලද හෙයින් සංස්ථාව වෙත අදාල සැපයුම්කරු විසින් භාරදෙනු ලැබුවේ කජු පිරිසැකසුම් යන්ත්‍රය පමණි.

එම පිරිසැකසුම් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පැවති ගැටළු සහගත තත්ත්වය හමුවේ එය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගැනීම ප්‍රමාද වූ අතර, අදාල සැපයුම්කරු විසින් එම යන්ත්‍රය සඳහා ගෙවීම් ඉල්ලුම් කිරීමේදී යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පැවති ගැටළු ඔහු විසින් අවස්ථා කිහිපයකදීම නිරාකරණය කරන ලදී. පසුව අදාල යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත යන්ත්‍රයේ ගැනුම් මිලෙන් 10%ක අගයක් රඳවාගෙන අදාල ගෙවීම් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

අදාල ගෙවීම් කිරීමෙන් පසුව යන්ත්‍රය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගත් මුල් අවස්ථාවේදී විනාඩි 15ක පමණ කාලයකින් පසුව ද , දෙවන අවස්ථාවේදී පැය 02ක පමණ කාලයකින් පසුව ද නැවත යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය ඇණහිටි අතර, ඉන්පසුව එය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට නොගන්නා ලදී. මෙම ගැටළුකාරී තත්ත්වය පිළිබඳව අදාල සැපයුම්කරුව කිහිප අවස්ථාවකදීම දැනුවත් කර, අදාල යන්ත්‍රය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කර දෙන ලෙස ඉල්ලීම් සිදුකළ ද ඔහු විසින් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලදී. එසේම ඉහත යන්ත්‍රයට අදාලව අලෙවියෙන් පසු සේවා සැපයීම සඳහා ගිවිසුමකට එළඹීමට සහභාගී වන ලෙස කිහිප වාරයකදීම දැනුම්දෙනු ලැබුව ද ඔහු එම සියලු අවස්ථා මඟහරින ලදී.

මෙම තත්ත්වය හමුවේ සංස්ථාවට අදාල යන්ත්‍රය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගැනීමට නොහැකිවීම මඟින් අලාභයක් සිදුවී තිබීම හා එම යන්ත්‍රයේ උපයෝගීතාවය අවමවීම යන කරුණු පදනම් කර ගනිමින් අදාල සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල නීති උපදෙස් ලබා ගැනීමට අදාල ලිපිලේඛන විෂයභාර අමාත්‍යාංශයේ නීති නිලධාරී වෙත යොමු කරන ලදී. සිය සේවාලාභියා වෙත ඉටුකිරීමට බැඳී ඇති වගකීම් පැහැර හැරීම සම්බන්ධව කරුණු දන්වන ලෙස අමාත්‍යාංශ නීති නිලධාරී විසින් ඉහත කී සැපයුම්කරු වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකරන ලද අතර, ඉදිරි නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි ලේඛන යොමු කරන ලෙසට නීති නිලධාරී විසින් තවදුරටත් උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව අදාල ඉදිරි කටයුතු සිදුකර ඇති අතර, ඉහත සඳහන් කරන ලද 10%ක රැඳවුම් මුදල ගෙවීම අත්හිටුවීමට කටයුතු කරන ලදී.

අනතුරුව මෙම යන්ත්‍රය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීම සඳහා කජු කැපීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රය හිමි කජු පිරිසැකසුම් යන්ත්‍ර නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනයක් වන බුද්ධි ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙතින් එම අලුත්වැඩියා කටයුතු සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් ඉල්ලුම්

කළ අතර, අදාල ආයතනයේ කාර්මිකයින් විසින් එම යන්ත්‍රය භෞතිකව පරීක්ෂා කර බලා එය  නැවත භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර දීමට රු. මිලියන 04ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව දැනට ඉහත පිරිසැකසුම් යන්ත්‍රයේ අත්‍යාවශ්‍ය වන බවට හඳුනාගෙන ඇති කජු කැපීම සිදුකරන යන්ත්‍ර කොටස මූලික වශයෙන් අලුත්වැඩියා කර ගැනීමට මෙම සංස්ථාව අපේක්ෂා කරන අතර, ඒ අතරතුර ඉහත සඳහන් කළ පරිදි මූලික සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ඉ) පහත අදහස් දක්වමි.

නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ජොෂ්ඨ ස්ථානභාර නිලධාරීගේ ඉල්ලීමට අනුව හා පසුකාලීනව නිර්මාණය වූ තත්ත්වයන් මත 2017 වර්ෂය මැද භාගයේදී පමණ නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ බොයිලේරුව අලුත්වැඩියා කිරීම සඳහා මිල ලංසු කැඳවීමට ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීමක් පළ කර ඇති අතර, ඒ අනුව එක් මිල ලංසුවක් පමණක් ලැබී ඇත. ලැබුනු මිල ලංසුව ද ඉතා ඉහළ අගයකින් යුක්ත වූ බැවින් සංස්ථාවේ එවකට ඒ සඳහා පැවති ප්‍රතිපාදනවල තත්ත්වය මත අදාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට යොමුවී නොමැත.

මෙම විගණන නිරීක්ෂණයේ සඳහන් කර ඇති පරිදි බොයිලේරුව මගින් ලෙලි කජු තැම්බීම සිදුකර එම ලෙලි කජු පිරිසැකසුම් කිරීමෙන් සම්පූර්ණ කජු මද ප්‍රතිශතය ඉහළ යාම වාසිදායක වුවත්, කජු මදවල සාමාන්‍ය රසයට වඩා රසය තරමක් අඩුවීම. කජු මද කල් තබාගත හැකි කාලය යම් මට්ටමකින් අඩුවීම වැනි කජු අලෙවිය කෙරෙහි අවාසිදායක /අහිතකර බලපෑම් ද එමගින් නිර්මාණය වේ.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කජු මිලදී ගන්නා පාරිභෝගිකයන් ඒ සඳහා යොමුවීමට ප්‍රධානම හේතුව වන්නේ අනෙකුත් කජු නිෂ්පාදකයන්ගේ කජුවලට සාපේක්ෂව සංස්ථා කජුවල රසය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතීම වන අතර, එම ඉල්ලුමට ගැළපෙන සේ කජු මද නිෂ්පාදනය කළයුතු බැවින් දැනට භාවිතයේ පවතින පාරම්පරික පිරිසැකසුම් කටයුතු සඳහා බොයිලේරුව යොදා නොගනී. කෙසේ නමුත් ඉදිරියේදී භාවිතයට ගැනීමට අපේක්ෂිත පූර්ණ ස්වයං යාන්ත්‍රීකරණ පිරිසැකසුම් ක්‍රමවේද ඔස්සේ ද කජු මද නිෂ්පාදනවල අදාල ගුණත්වය හා රසය ආරක්ෂා වන පරිදි කජු පිරිසැකසුම් කටයුතු වෙනුවෙන් ලෙලි කජු තැම්බීම සඳහා බොයිලේරුව නැවත යොදා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් අවශ්‍ය අධ්‍යයන කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ඊ) කජු ක්ෂේත්‍රයේ පවතින එකම රාජ්‍ය ආයතනය වශයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත දිවයිනෙහි කජු වගාව, කජු ව්‍යාප්තිය, කජු පිරිසැකසුම, කජු පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය, කජු අලෙවිකරණය යනාදී ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් අදාල කාර්යයන් සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම පැවරී ඇත.

2020 හා 2021 වර්ෂයන් හිදී දිවයින පුරා පැතිර ගිය Covid-19 වසංගත රෝග තත්ත්වය හමුවේ කජු ක්ෂේත්‍රයේ වගාකරුවන්, පිරිසැකසුම්කරුවන්, අලෙවිකරුවන් යනාදී විශාල පිරිසකට සිය ආදායම් අහිමි වී ගිය අතර, එසේ ආර්ථික වශයෙන් අපහසුතාවයට පත් වූ කජු ක්ෂේත්‍රය නියෝජනය කරන පුද්ගලයන් එම අපහසුතාවයන්ගෙන් මුදවා ගැනීම සඳහා කටයුතු කිරීමේ වගකීම ද මෙම සංස්ථාව වෙත පැවරී ඇති බැවින් මෙම තත්ත්වයට විසඳුම් ලබා දීම සඳහා අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී මෙම සංස්ථාවේ එවකට සිටි සභාපතිතුමියගේ ඉල්ලීම මත සහ එවකට විෂය භාර රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල සිදු කරන නිරීක්ෂණ චාරිකා කිහිපයකදී සිදු කරන ලද නිරීක්ෂණ වල ප්‍රතිඵලයක් ද ලෙස සංස්ථාවට හා කජු ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන පිරිසැකසුම්කරුවන්ට පොදුවේ ප්‍රතිලාභ ලැබෙන පරිද්දෙන් මෙම විගණන නිරීක්ෂණයට පදනම් වූ කජු ඇසුරුම් යන්ත්‍රය හා තවත් කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතියක් (මෙම පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය සම්බන්ධයෙන් මෙම විගණකාධිපති වාර්තාවේ අංක 3.4 (අ) යටතේ විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.) මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාව වෙත ලබාදීමට කටයුතු කරන ලදී.

සංස්ථාවේ කජු පිරිසැකසුම් කටයුතුවල අවසාන අගය එකතු කිරීමේ කටයුතු හා අවසාන ඇසුරුම් කටයුතු සිදුකරනු ලබන්නේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ වන බැවින් කජු ඇසුරුම් යන්ත්‍රය එම පරිශ්‍රයේ ස්ථාපනය කරන ලද අතර, කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ද නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කළ හැකි වුවත්, ක්ෂේත්‍රයේ පුද්ගලයන්ට වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි පරිද්දෙන්. දිවයිනෙහි කජු කර්මාන්තයේ කටයුතු වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානයේ එම කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ස්ථාපනය කරන ලදී.

එමෙන්ම 2020 වර්ෂය අග භාගයේදී පමණ ඉදිරිපත් වූ 2021 වර්ෂයේ රාජ්‍ය අයවැය ප්‍රකාශනයට අනුව එවකට විෂය භාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාවේ මන්නාරම, කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා රු.මිලියන 225ක්

ප්‍රතිපාදන සංස්ථාව වෙත ලබාදෙන ලද අතර, එම රු. මිලියන 225ක ප්‍රතිපාදන වලින් රු. මිලියන 125ක් කොන්ඩච්චි වතුයායේ 2021 වර්ෂය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ අක්කර 1000ක භූමි කොටසක නව කජු වගාවක් සිදු කිරීම හා අනෙකුත් සංවර්ධන හා යටිතල පහසුකම් වෙනුවෙන් වෙන් කර තිබිණි. ඒ අනුව වසර 03ක කාල සීමාවක් තුළදී එම අක්කර 1000ක භූමි ප්‍රමාණය තුළ ක්‍රමිකව නව කජු වගාව සිදු කර ලැබෙන අස්වනු ප්‍රමාණය සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර, ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුතුව එම ලෙලි කජු නිෂ්පාදනවල පිරිසැකසුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරිසැකසුම් හා ඇසුරුම් යන්ත්‍ර වල අවශ්‍යතාවය ද මෙම මිලදී ගැනීම්වලදී සැලකිල්ලට භාජනය කරන ලදී.

කෙසේ නමුත් Covid-19 වසංගත රෝග තත්ත්වය දීර්ඝ කාලයක් දිවයින පුරා පැවතීම හා ඉන්පසුව ඇති වූ ආර්ථික අවපාත තත්ත්වය හේතු කොටගෙන අදාල නව කජු වගාවන්වල කටයුතු නිසි ලෙස සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අතර, ඒ අනුව ඉහත පරිදි මිලට යන්ත්‍ර මඟින් ද අපේක්ෂිත නිෂ්පාදිත ධාරිතාවයන් ළඟා කර ගැනීමට නොහැකි විය. මේ අනුව විෂයගත ඇසුරුම් යන්ත්‍රය සංස්ථාවේ වර්තමාන කජු නිෂ්පාදන ධාරිතාවයන්ට නොගැලපෙන හෙයින් එම ඇසුරුම් යන්ත්‍රය විධිමත් ප්‍රසම්පාදන ක්‍රම වේදයක් භාවිතයෙන් උපරිම වෙළෙඳපොල මිල ගණනකට අලෙවි කර, එම මුදලින් සංස්ථාවේ වර්තමාන නිෂ්පාදන ධාරිතාවයට ගැලපෙන නව ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද පත්‍රිකාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

2.3 (උ) පහත අදහස් දක්වමි.

අදාල අලෙවිසැල් ස්ථාපනය කිරීමේ කටයුතු නිම කිරීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය මගින් වෙන්කරන ලද කාලසීමාව ඉතා සීමිත වූ හෙයින් නාරාහේන්පිට හා වැල්ලවත්ත යන කජු අලෙවිසැල් පිහිටුවීමේ කටයුතු/නිර්මාණය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර විධිමත් පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමට හෝ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට නොහැකි වී ඇති නමුදු අදාල අලෙවිසැල් පිහිටුවීමේ කටයුතු/නිර්මාණය කිරීමේ කටයුතු නිම කළ පසු ඒ සම්බන්ධයෙන් අදාල තොරතුරු සහිත පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.

එසේම අදාල අලෙවිසැල් පිහිටුවීමේ කටයුතු/නිර්මාණය කිරීමේ කටයුතු වෙනුවෙන් පැවති සීමිත කාලසීමාවට අනුව, අදාල මිල ලංසු කැඳවීම් සඳහා වෙළෙඳපොල මිල සඳැහුම් ක්‍රමය යටතේ අදාල නිර්මාණකරුවන් සම්බන්ධ තොරතුරු සපයා ගන්නා ලද්දේ අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාලා ඇසුරින් සහ අලෙවිසැල් නිර්මාණ ක්ෂේත්‍රයට සම්බන්ධ අයවලුන්ගෙන් වන අතර, එම කටයුතු සිදුකරන ලද්දේ සංස්ථාවේ අලෙවි අංශය මඟිනි.

මෙම අලෙවිසැල් පිහිටුවීමේ කටයුතු සඳහා අදාල නිර්මාණකරු විසින් සිදුකරන ලද ඉල්ලීම සලකා බලා අදාල අවස්ථාවේදී වැඩ නිම කිරීම්වල තත්ත්වයට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් 75%ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා ඇති අතර, අදාල අලෙවිසැල් පිහිටුවීමේ වැඩ කටයුතු අවසාන කර තිබුව ද ඉතිරි 25%ක මුදල් මෙතෙක් ගෙවීමට කටයුතු කර නොමැත.

2.3 (උ) පහත අදහස් දක්වමි.

මීට පෙර සංස්ථාවට අයත්ව පැවති මිරිජ්ජවිල සංචාරක බංගලාව රජයට පවරාගත් පසු ඒ වෙනුවට නව සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා අවශ්‍යතාවය පැවති අවස්ථාවේදී විෂයභාර අමාත්‍යාංශය මඟින් සංස්ථාවේ ඇඹිලිපිටිය, චන්ද්‍රිකාවැව තවාන් පරිශ්‍රයේ සංචාරක බංගලාවක් ඉදිකිරීමට ප්‍රතිපාදන ලබාදෙන ලදී. එම සංචාරක බංගලාව ඉදිකිරීමේදී නිල නිවසේ අවශ්‍යතාවය ද සැලකිල්ලට ගෙන සැලසුම් සකස් කළ හැකි බැවින් ද, ඒ අනුව ඇඹිලිපිටිය, චන්ද්‍රිකාවැව තවාන් පරිශ්‍රයේ පැළ තවානේ වෙනමම නිල නිවසක් ඉදිකිරීම අනවශ්‍ය වන බැවින් ද එම නිල නිවස වෙනුවට වෙනත් ස්ථානයක නිල නිවසක් ඉදිකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ඒ අනුව සංස්ථාවේ පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීට නිල නිවසක් හා පුත්තලම පර්යේෂණ අංශයට විද්‍යාගාරයක් යන අවශ්‍යතාවයන් දෙකම සපුරා ගැනීම ඉලක්ක කර ගනිමින් පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි අදාල ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට කළමනාකරණය විසින් තීරණය කරන ලදී. මේ අනුව නිවස ඉදිකරන ස්ථානය පමණක් වෙනස් වීම මිස ඇස්තමේන්තුගත වියදම් හෝ වෙනත් ආශ්‍රිත කරුණුවල කිසිදු වෙනසක් මෙහිදී සිදුවී නොමැත.

මෙහි සඳහන් නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් සංස්ථාව මඟින් මූලික වශයෙන් ප්‍රසම්පාදන ක්‍රමවේදය ලෙස යොදා ගැනීමට සැලසුම් කරන ලද්දේ වෙළෙඳපොල මිල සඳැහුම් ක්‍රමය යටතේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පිහිටුවා ප්‍රදේශයේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ලංසු කැඳවා ඒ අනුව කටයුතු කිරීමේ ක්‍රමවේදයයි.

ඒ අනුව අදාල ක්‍රමවේදය ඔස්සේ කමිටු ස්ථාපනය කර කටයුතු කිරීමට විෂයභාර අමාත්‍යාංශයෙන් ලිඛිත අනුමැතිය ලබාගෙන අදාල කමිටු පිහිටුවා ඒ හරහා එම කටයුතු ක්‍රියාත්මක කළ ද, ලංසුකරුවන්ගේ ලැබුනු මිල ලංසු වටිනාකමින් ඉතා වැඩි හා අනුමත ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ නොහැකි මිල ගණන්වලින් යුක්ත වූ බැවින් එම ක්‍රමවේදය ඔස්සේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම ප්‍රායෝගික නොවීය. මෙම ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත්කිරීම්, මිල ලංසු කැඳවීම්, මිල ලංසු ඇගයීම් යනාදී සියලු කටයුතු අදාල ලිපි ලේඛන ප්‍රසම්පාදන ගොනුවේ ඇතුළත්ව පවතී.

2.3 (එ) පහත අදහස් දක්වමි.

2017 වර්ෂයේදී බාහිර පාර්ශවකරුවන් සමඟ ඇති කරගත් ගිවිසුම් මඟින් පුත්තලම වතුයායේ භූමි කොටස් කජු සමඟ අතුරු භෝග වගා කටයුතු සඳහා වසර 05ක කාලසීමාවක් සඳහා එම බාහිර වගාකරුවන් සඳහා ලබා දෙන ලදී. ඒ අනුව සංස්ථාවේ ප්‍රතිපාදන භාවිත කිරීමකින් තොරව මෙම වතුයායේ නැවත වගා කටයුතු සිදුකරන ලද අතර, සංස්ථාව මගින් දැරිය යුතුව තිබූ විශාල පිරිවැයක් එමඟින් ඉතිරි කර ගැනීමට හැකි විය.

අදාල ගිවිසුම් අනුව එම බාහිර වගාකරුවන් වසර 05ක කාලසීමාවක් කජු වගාව නඩත්තුව කරමින් ඔවුන්ගේ අතුරු භෝග වගා කටයුතු සිදුකළ යුතුව තිබුණි, ඒ අනුව වසර 02ක පමණ කාලයක් මෙම බාහිර වගාකරුවන් අදාල ගිවිසුම් ප්‍රකාරව වගා කටයුතු සිදුකරන ලද අතර, එම වගාකරුවන් සිය අතුරු භෝග වගා කටයුතුවලින් අලාභ ලැබීමේ හේතුවෙන් දෙවන වසරෙන් පසුව අතුරු භෝග වගාවන් නවතා දමන ලදී. ඒ සමගම ඔවුන් විසින් කජු වගාවේ නඩත්තු කටයුතු ද නවතා දමන ලද අතර, එතැන් සිට කජු වගාවේ නඩත්තු කටයුතු සංස්ථාවේ ප්‍රතිපාදන මත සිදුකරන ලදී. එම වගාකරුවන් සිය ගිවිසුම් උල්ලංඝනය කරමින් කටයුතු කර තිබූ හෙයින් නිසි ක්‍රමවේදයට අනුව දැනුම්දීම් සිදුකර අදාල ගිවිසුම් සියල්ල අවලංගු කිරීමට කටයුතු කරන ලදී.

වතුයායේ ඇලෙන් ඉහළ කොටස වන මුංගිල්ආරු උප කොටසේ අතුරු භෝග වගාකරුවන් විසින් සිදුකරන ලද මඤ්ඤොක්කා වගාවක් පැවතිණි, එම බාහිර වගාකරුවන් විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව මඤ්ඤොක්කා වගාව ගලවා ඉවත්කර ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා දෙන ලද නමුත් වෙළඳ පොල ඉල්ලුමක් නොමැතිවීම මත එම කටයුතු මන්දගාමීව සිදුවී පසුව 2020 වර්ෂයේදී ඔවුන් විසින් වගාව අත්හැර දමන ලදී.

වතුයායේ එම කොටස පූර්ණව වල් මර්ධනය කිරීමට විශාල මුදලක් වැයවන බැවින් එම අවස්ථාවේදී ඒ සඳහා ප්‍රතිපාදන නොමැතිවීම මත කජු ගස් වටා ඇති මඤ්ඤොක්කා වගාව ගලවා ඉවත්කර කජු පැළ ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන ලදී.

ඉන්පසු 2020 වර්ෂයේදී ද මෙම මුංගිල්ආරු උප කොටසේ භූමි කොටස් කිහිපයක් වසරක් පාසා ගිවිසුම් අළුත්කර ගැනීමේ පදනම මත අතුරු භෝග වගාව සඳහා නැවත බාහිර වගාකරුවන් සඳහා ලබා දෙනු ලැබුව ද එම වගාකරුවන් ද පෙර පරිදිම ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මත ඔවුන්ගේ ද ගිවිසුම් අවලංගු කර දමන ලදී.

මෙම කරුණු හේතුවෙන් කජු වගා කරන ලද භූමියේ කැලය ක්‍රමිකව වර්ධනය වූ අතර, කෙසේ නමුත් සංස්ථාවේ ප්‍රතිපාදන භාවිත කරමින් හැකි පරිදි මෙම භූමි කොටස් නඩත්තු කර කජු ගස් මිය යාමට නොදී ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන ලදී.

2021 වර්ෂයේදී මෙම උප කොටසේ කැළය එළිකිරීමට පුවත්පත් දැන්වීමක් පළකරන ලද අතර, එක් ලංසුකරුවෙකු පමණක් ඒ සඳහා ලංසු ඉදිරිපත් කර තිබූ බැවින් එම ප්‍රසම්පාදන කටයුතු අහෝසි කිරීමට සිදුවිය.

ප්‍රවර්තන වර්ෂයේදී මෙම කොටසේ පවතින කජු පැළ අතර තීරයේ වල් මර්ධන කටයුතු සිදුකිරීම සඳහා සැලසුම් සකස් කර ඇති අතර, ඒ අනුව මෙම උප කොටසෙන් ලැබීමට නියමිත ලෙලි කජු අස්වැන්න විනාශ වී යා නොදී ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ඒ) පහත අදහස් දක්වමි.

විෂයගත කාලසීමාව තුළදී දිවයින පුරා පැතිරගිය Covid-19 වසංගත රෝගී තත්ත්වය හා ඉන්පසුව ඇති වූ ආර්ථික අවපාත තත්ත්වය මත නිර්මාණය වූ විවිධ ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන මෙහි සඳහන් කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියේ කටයුතුවල ද්‍රව්‍යාත්මක ප්‍රමාදයන් සිදුවූ අතර, කෙසේ නමුත් මෙහි සඳහන් පරිදි අදාල ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් විෂයභාර අමාත්‍යාංශයෙන් ලැබී ඇති රු. 225,000,000/- ක ප්‍රතිපාදනවලින් 2023.12.31 දින වනවිට රු. 92,727,485/- ක මුදලක් එම ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වැය කර ඇත. එසේම වතුයායේ නව කජු වගාව සිදුකරන භූමි කොටසේ කැළෑ එළිකිරීම හා සහ වතුයායේ ඉදිකිරීමට නියමිත සංචාරක බංගලාව සඳහා විදුලි උපකරණ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යන කාර්යයන්ට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතින අතර, ඊට අතිරේකව වලවල් කැපීම, වතුයාය සඳහා කෘෂි උපකරණ, ක්ෂේත්‍ර උපකරණ හා කාර්යාල

උපකරණ මිලදී ගැනීම යන අවසාන අදියරෙහි පවතින ප්‍රසම්පාදන කටයුතු හරහා ඉදිරි කෙටිකාලසීමාව තුළදී තවදුරටත් වැය කිරීමට අපේක්ෂිත මුදල රු. 90,000,000/-කට ආසන්න වේ. අනෙකුත් ප්‍රධාන වැයකිරීම්වලට අදාල ප්‍රසම්පාදන කටයුතු ද ආරම්භ කර ඇති අතර, ඒ අනුව සැලසුම් කර ඇති පරිදි නියමිත කාලසීමාව තුළදී මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ඔ) පහත අදහස් දක්වමි.

මූලික ව්‍යාපෘතියේ ජල බවුසර 14ක් නිෂ්පාදනය කරවා ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුන ද ක්ෂේත්‍රයේ පැවති අවශ්‍යතාවයන් හේතුකොටගෙන පසුව එය ජල බවුසර 15ක් ලෙස සංශෝධනය කරන ලදී.

අදාල බවුසර සඳහා අවශ්‍ය ට්‍රැක්ටර් රථ අලුතින් මිලදී ගැනීම වෙනුවට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සතුව පවතින ට්‍රැක්ටර් රථ 14ක් නොමිලයේ සංස්ථාව වෙත ලබාගෙන ඒවා අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කරදෙන ලදී.

ඒ අනුව අලුත්වැඩියා කටයුතු සිදුකර, ඉහත ජල බවුසර සඳහා භාවිත කළ හැකි මට්ටමේ ට්‍රැක්ටර් රථ 08ක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙම සංස්ථාව වෙත නොමිලයේ ලබාදෙන ලදී. එම ට්‍රැක්ටර් රථවලින් 04ක සිදුකළයුතුව පැවති අලුත්වැඩියා කටයුතු නිම කර මේවනවිට එම ට්‍රැක්ටර් රථ අදාල කටයුතු සඳහා භාවිතයට ගනු ලබන අතර, ඉතිරි ට්‍රැක්ටර් රථ 04හි ද අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකරගෙන යනු ලැබේ. මීට අතිරේකව කොන්ඩච්චි වතුයාය සතුව පැවති ට්‍රැක්ටර් 02ක් ද අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇත. එක් ජල බවුසරයක් සඳහා එක් ට්‍රැක්ටර් රථයක් බැගින් පැවතීම අත්‍යාවශ්‍ය නොවන බැවින් නව ජල බවුසර සියල්ල භාවිතයට ගැනීම සඳහා ඉහත සඳහන් කරන ලද ට්‍රැක්ටර් රථ ප්‍රමාණය (මුළු ට්‍රැක්ටර් රථ ගණන 10කි.) ප්‍රමාණවත් වේ.

ඒ අනුව ඉහත සඳහන් ජල බවුසර සියල්ල හැකි උපරිම ආකාරයෙන් දැනට පවතින ට්‍රැක්ටර් රථ භාවිතයෙන් සංස්ථාවේ වතුයායන් හි කටයුතු සඳහා භාවිතයට ගන්නා බැවින්, මෙම විගණන ඡේදයේ සඳහන් පරිදි ජල බවුසර භාවිත කිරීමට නොහැකි වීම මත ඒවා මිලදී ගැනීමට වැය කර ඇති මුදල් නිෂ්කාර්ය වීමක් සිදුවී නොමැත.

එසේම අදාල ජල බවුසර නිෂ්පාදනය කිරීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගෙන් ද සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් සිදුකරන ලද පරීක්ෂාවන්ට අනුව එම

ජල බවුසරවල සුදුයකඩ තහඩු වෑද්දුම් ස්ථානවල හෝ වෙනත් කිසිදු ස්ථානයක මල බැඳීම් සිදුවී ඇති බවට වාර්තා නොවූ අතර, ඒ අනුව අදාල පිරිවිතරයන්ට අනුව සුදු යකඩ බවුසර නිපදවීම සිදුකර ඇති බවට තාක්ෂණ ඇගයීම් කමිටුව මඟින් ලිඛිතව තහවුරු කර තිබිණි.

2.3 (ඕ) සංස්ථාවේ කොන්ඩච්චි වතුයාය විල්පත්තු රක්ෂිතයට මායිම්ව පිහිටා ඇති හෙයින් එම වතුයායේ අක්කර 6498ක භූමි ප්‍රදේශයක් ආවරණය කරමින් කිලෝමීටර් 26ක දුර ප්‍රමාණයක් සඳහා විදුලි වැට ඉදිකිරීමේදී ඒ සඳහා මූලික වශයෙන් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසරය ලබා ගැනීමට සිදුවූ අතර, එහිදී විල්පත්තු රක්ෂිතයේ මායිම සහ කොන්ඩච්චි වතුයායේ මායිම සම්බන්ධ නිරාකරණය කර ගැනීම් සිදුකළයුතු වූ බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගතවිය. එසේම අදාල අවසරයන් ලබා ගැනීම සඳහා ද දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

අදාල අවසර ලබා ගැනීමේ කටයුතුවලට සමගාමීව මෙම විදුලි වැට ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාව හා දැනට කොන්ඩච්චි වතුයායේ භූමි කොටසක කජු වගා කටයුතු සිදුකර ඇති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර සාකච්ඡා වට කිහිපයක්ම ක්‍රියාත්මක වූ අතර, මෙම විදුලි වැට ඉදිකිරීම මඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කජු වගා භූමිය සඳහා ද ආරක්ෂාවක් ලැබෙන බැවින් අදාල විදුලි වැට ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එකඟවූ හෙයින් විදුලි වැට ඉදිකිරීමේ පිරිවැය සැලකිය යුතු අගයකින් අඩුකර ගැනීමට හැකියාව ලැබිණි.

එසේම මෙම විදුලි වැට ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සියල්ල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන අතර, මේ වන විට එම දෙපාර්තමේන්තුව මඟින් අදාල ඉදිකිරීම් කටයුතුවලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීමක් පළ කර ඇත. ඒ සඳහා ද සංස්ථාව මඟින් රු. 513,912/-ක මුදලක් ගෙවා ඇත. ඒ අනුව මේ වන විට විෂයගත කාර්යය සඳහා මිල ලංසු කැඳවා ඇති අතර, ඒ අනුව අදාල ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ක) විදුලිබල මණ්ඩලයේ පවතින කොන්දේසිවලට අනුව විදුලි පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය මුළු මුදල එකවර ගෙවීම සිදුකළයුතු හෙයින් ඒ අනුව අදාල මුළු ගෙවීම් සිදුකරන ලදී. ව්‍යාපෘති කාලසීමාව තුළදී රටෙහි ආර්ථික තත්ත්වයේ සිදුවූ වෙනස්කම්වලට අනුව විදුලි බල මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන ලද සංශෝධිත ස්ථාපන පිරිවැයට අනුව මේ වන විට එම මණ්ඩලය වෙත සංස්ථාව මඟින් ගෙවා ඇති මුළු මුදල රු. 28,209,434/කි.

විදුලි රැහැන් ඇදීම සිදුකරනු ලබන මාර්ගයේ ගස් කපා ඉවත් කර ගැනීමේ වගකීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා දැව සංස්ථාව වෙත පැවරී තිබූ හෙයින් ඒ සම්බන්ධයෙන් නිතර නිතර දැනුම්දීම් සිදුකළ ද අදාල කාලවකවානුව තුළ පැවති කොරෝනා වසංගතය පැතිරයාමේ තත්ත්වය මත පැනවූ නිරෝධායන ඇඳිරි නීතිය හේතුකොටගෙන එම කටයුතුවල විශාල ප්‍රමාදයක් සිදුවිය.

කෙසේ නමුත් මේ වන විට කොන්ඩච්චි වතුයාය වෙත විදුලිය සැපයීමේ කටයුතු සම්පූර්ණ වී ඇති අතර, ඒ අනුව විදුලි සැපයුම සඳහා පරිපථ සම්පූර්ණ කිරීමෙන් පසු මේ වන විට වතුයායේ එක් නිල නිවාසයක් සඳහා විදුලි සැපයුම ලබා ගැනීමට ද කටයුතු කර ඇත. ඉතිරි නිල නිවාස හා ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර, එම කටයුතු කඩිනමින් සම්පූර්ණ කර එම නිල නිවාස හා අනෙකුත් ගොඩනැගිලි සඳහා ද විදුලි සැපයුම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ග) අදාල කාලවකවානුව තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුකොටගෙන දැඩි ලෙස ආනයන සීමාකිරීම් සිදුවීම මත දේශීය අමුද්‍රව්‍යවල මිල ගණන් දැඩි ලෙස ඉහළ යාම නිසා මුලික වශයෙන් සෙවන ගෘහ සැකිලි ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත කර තිබූ මුදල ඒ සඳහා කිසිලෙසකින්වත් ප්‍රමාණවත් නොවීය. මේ නිසා අදාල සෙවන ගෘහ සැකිලි ඉදිකිරීමේ කටයුතු නවතා දැමීමට සිදුවූවත්, සාමාන්‍ය පරිදි ලී දඬු යොදා ගනිමින් අදාල තවාන්වල සැකිලි නිර්මාණය කර ඉහත පරිදි මිලට ගත් සෙවන දැල් තවාන් කටයුතු සඳහා භාවිත කරන ලදී. මෙම එම සෙවන දැල් ඉදිරි කාලසීමාවේදීත් තවාන් කටයුතු සඳහා භාවිත කිරීමට යොදාගනු ලැබේ.

වර්තමානයේදී අදාල ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල යම් අඩුවීමක් සිදුවී ඇති බැවින් නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් හෝ ඉහත දැල් ගෘහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සලකා බැලීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ඝ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් මෙම සංස්ථාව මඟින් රජයේ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින රු. 3,500,000/- ක ණය ශේෂය, මීට පෙර මෙම වාර්තාවේ අංක 1.2 (ඌ) යටතේ සඳහන්ව පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් (වර්තමානයේ අහෝසි වී ඇති) අයවීමට පවතින රු. 9,466,200/- ක ණයගැති ශේෂය සමඟ හිලව් කර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ලිපියට අනුව අදාල හිලව් කිරීම් සඳහා ඉඩප්‍රස්ථාවක් නොමැති බැවින් අවශ්‍ය ඉදිරි උපදෙස් ලබා ගැනීම සඳහා එම රාජ්‍ය

ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද ලිපිය 2023.12.22 වන දින පැවති සංස්ථාවේ විගණන කමිටු රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව මීට පෙර ද සඳහන් කළ පරිදි එහිදී ඉහත රු. 9,466,200/-ක ණය මුදල අයකරවා ගැනීමේ කටයුතු සඳහා උපදෙස් ඉල්ලුම් කිරීමට මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ලිපියක් නිකුත් කිරීමට තීරණය කරන ලද අතර, එලෙස ලැබෙන උපදෙස් මත යම් මුදලක් අයකරවා ගතහොත් එම මුදල්වලින් 50% ක් මෙම වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින ණය මුදල පියවීම සඳහා යොදා ගැනීමට ද තවදුරටත් තීරණය විය. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ට) පහත අදහස් දක්වමි.

සංස්ථා විගණන කමිටු නිර්දේශයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබාදී ඇති අනුමැතිය පරිදි ප්‍රවර්තන වර්ෂයේදී මෙහි සඳහන්ව ඇති සංස්ථාවේ වතුයායන් හා බීජ උද්‍යානවල කප්පු ගස් සංගණනයන් සිදුකිරීම හා කප්පු ගස් රෙජිස්තරයන් පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ අනුව අදාල කටයුතු සම්පූර්ණ කරනු ලැබේ.

2.3 (ඩ) පහත අදහස් දක්වමි.

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන, ලංකා බැංකුවේ ජංගම ගිණුම් 02 ක් (අංක 1633704 හා 1633705 දරණ ජංගම ගිණුම්) හා ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් 01 ක් (අංක 1649789 දරණ ඉතිරි කිරීමේ ගිණුම) හැරුනුකොට සංස්ථාවේ පැවති ඉතිරි සියලුම බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදුකර ඇත.

*******